

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

(PGIIM)

කොළඹ විශ්වවිද්‍යාලය

2022 වාර්ෂික වාර්තාව සහ ගිණුම්

මෙම වාර්තාව පිළිබඳව

මෙම වාර්තාවට දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIIM) පිළිබඳ 2022 වර්ෂය සඳහා වූ වාර්ෂික තොරතුරු ඇතුළත් වේ. එමඟින් 2022 ජනවාරි මස 01 වැනි දින සිට දෙසැම්බර් මස 31 වැනි දින දක්වා දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පොදු තොරතුරු, කාර්යසාධනය සහ ජයග්‍රහණ පිළිබඳ තොරතුරු ඇතුළත් වේ.

වාර්තාකරණ රාමු සහ විෂයපථය

මෙම වාර්තාවට පුහුණුවන්නන්ගේ, සිදු කරන අධ්‍යයන වැඩසටහන්, මානව සම්පත්, ජයග්‍රහණ සහ මූල්‍ය කාර්යසාධනය සහ වාර්ෂික ගිණුම් ආදිය පිළිබඳ විස්තර අන්තර්ගත වේ.

දැක්ම

රටේ සෞඛ්‍ය අවශ්‍යතාවන් සපුරාලීම සහ ප්‍රතිචාරාත්මක ආකාරයකින් කලාපීය සහ ගෝලීය සෞඛ්‍ය වෙනුවෙන් කැපවීම පිණිස ඉහළ වෘත්තීමය ප්‍රමිතීන් අත්කර ගත් ආයුර්වේදය, යුනානි, සිද්ධ සහ සාම්ප්‍රදායක සෞඛ්‍ය විශේෂඥයින් බිහි කරන විශිෂ්ටත්වයේ කේන්ද්‍රස්ථානයක් බවට පත්වීම.

මෙහෙවර

ශ්‍රී ලංකාවේ, කලාපයේ සහ ලෝකයේ ජනතාව වෙනුවෙන් ප්‍රශස්ත මානුෂීය සෞඛ්‍ය රැකවරණයන් ලබා දීම පිණිස විශිෂ්ට සායනික සහ පර්යේෂණ නිපුණතාවලින් සවිබල, ආයුර්වේදය, යුනානි, සිද්ධ සහ සාම්ප්‍රදායක වෛද්‍ය ක්‍රම පිළිබඳ දැනුම සහ කුසලතා ඇති විශේෂඥයින් බිහි කිරීම.

ඉලක්ක

1. රටේ සෞඛ්‍ය අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීම පිණිස ආයුර්වේද, යුනානි, සිද්ධ සහ සාම්ප්‍රදායක සෞඛ්‍ය වෘත්තිකයින් බිහි කිරීම
2. දේශීය වෛද්‍ය විද්‍යා අංශය තුළ විශිෂ්ටත්වයක් අත් කර ගැනීම පිණිස නම්‍යශීලී ශික්ෂණ සහ ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම
3. දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ ක්ෂේත්‍රය තුළ පර්යේෂණ සංස්කෘතියක් ඇති කිරීම
4. කාර්යක්ෂම සහ ඵලදායී පරිපාලන සහ මූල්‍ය කළමනාකරණයක් හරහා විශිෂ්ට පාලන ක්‍රමයක් ගොඩනැගීම
5. ආයතනයේ ගුණාත්මකභාවය සහතික කිරීම සහ වර්ධනය වන අධ්‍යාපනික අවශ්‍යතාවන්ට විසඳුම් සෙවීම පිණිස යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීම.

පටුන

පිටු අංක.

වාර්තාව පිළිබඳව…….. **i**

වාර්තාකරණ රාමු සහ විෂයපථය ……. **i**

දැක්ම ……..... **ii**

මෙහෙවර …….. **ii**

ඉලක්ක …… **ii**

අධ්‍යක්ෂවරයාගේ පණිවුඩය…… **iv**

වගු ලැයිස්තුව ……. **v**

රූපසටහන් ලැයිස්තුව …….. **v**

කෙටි පද ලැයිස්තුව ……. **v**

පළමු වැනි කොටස - වාර්ෂික වාර්තාව – 2022

1 දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය …….. **2**

1.1 ආයතනය - කෙටි හැඳින්වීම …… **2**

1.2 ආයතනයේ අධ්‍යක්ෂවරයා…… **5**

1.3 කළමනාකරණ මණ්ඩලය…… **5**

1.4 මූල්‍ය කමිටුව……. **7**

1.5 අධ්‍යයන මණ්ඩල……. **7**

1.6 පුස්තකාල කමිටුව…….. **9**

1.7 විෂයමාලා සංවර්ධනය සහ ඇගයීම් කමිටුව…… **10**

1.8 අන්තර්ජාතික සහයෝගීතාව සඳහා වූ කමිටුව …….. **11**

1.9 අභ්‍යන්තර තත්ත්ව සහතික කුටිය…… **12**

2 2022 වර්ෂය තුළ අධ්‍යයන කටයුතු

2.1 PGIIM සඳහා පුහුණුවන්නන් බඳවා ගැනීම …… **13**

2.2 PGIIM හි පුහුණුවන්නන්…… **14**

2.3 විශේෂඥ වෛද්‍ය උපාධි වැඩසටහන් අනුමත කිරීම…….. **15**

2.4 ආයුර්වේද විශේෂඥ වෛද්‍ය උපාධිය සහ අධ්‍යයන මණ්ඩල සහතිකකරණ වැඩසටහන් …….. **15**

2.5 යුනානි විශේෂඥ වෛද්‍ය උපාධිය සහ මණ්ඩල සහතිකකරණ වැඩසටහන් …… 16

2.6 සිද්ධ විශේෂඥ වෛද්‍ය උපාධිය සහ මණ්ඩල සහතිකකරණ වැඩසටහන් …… 16

3 දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පරිපාලන අංශ සහ පුස්තකාලය

3.1 පරිපාලන අංශය…….. **17**

3.2 මූල්‍ය අංශය……... **17**

3.3 පුස්තකාලය…….. **18**

4 මානව සම්පත් දත්ත

4.1 අනුමත සේවක සංඛ්‍යාව සහ වර්තමාන කාර්ය මණ්ඩලය ……... **19**

දෙවැනි කොටස - අවසාන ගිණුම් සහ විගණන තොරතුරු

5 2022 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන…… **21**

6 විගණකාධිපති වාර්තාව……..... **54**

7 විගණකාධිපති වාර්තාවට පිළිතුර …… **59**

8 තිරසර සංවර්ධනය සඳහා යෝජනාව …… **62**

අධ්‍යක්ෂවරයාගේ පණිවුඩය



දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2022 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම මාගේ මහත් ප්‍රීතියට කරුණකි. සෞඛ්‍ය ව්‍යවස්ථා සංග්‍රහයට සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ ආයුර්වේද, සිද්ධ සහ යුනානි ආයතන/ පීඨ සඳහා වූ ශාස්ත්‍රීය ලේඛන අනුව දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ආයුර්වේද, සිද්ධ සහ යුනානි යන ප්‍රධාන ක්ෂේත්‍රවල දේශීය වෛද්‍ය වෘත්තිකයින් සඳහා විශේෂඥ පුහුණුව ලබාදීමේ වගකීම ඇති එකම ආයතනය වේ.

අපගේ අධ්‍යයන මණ්ඩල තුන සහ විශේෂඥ මණ්ඩල දොළහ, මණ්ඩල සහතිකය සහිත විශේෂඥ වෛද්‍ය උපාධිය දක්වා වූ වැඩසටහන් හයක් පවත්වනු ලබයි. නව විශේෂඥ වෛද්‍ය උපාධි වැඩසටහන් හයක් සඳහා වූ ප්‍රවිවරණයන් (Prospectuses) සෙනෙට් සභාව මඟින් අනුමත කර ඇති අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීම පිණිස එහි තත්ත්ව සහතික කවුන්සිලයට යොමු කර ඇත. ආයුර්වේද විශේෂඥ වෛද්‍ය උපාධිය සඳහා තෝරා ගැනීමේ පරීක්ෂණයක් 2022 වර්ෂයේ දී පවත්වන ලද අතර අපේක්ෂකයින් 13 දෙනෙක් තෝරා ගන්නා ලදී. කළමනාකරණ මණ්ඩලයේ ස්ථාවර කමිටුවක් ලෙස අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ කේන්ද්‍රය ස්ථාපිත කරන ලදී. 2022 වර්ෂයේදී පුස්තකාලය සඳහා අවශ්‍ය කළ ග්‍රන්ථ සහ කාර්යාලයීය උපකරණ මිල දී ගැනීමට සමත්වූ අතර පුස්තකාලය විවෘත කරන ලදී. එමෙන්ම දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වෙබ් අඩවිය දියත් කිරීම ද 2022 වර්ෂය තුළ දී සිදු කරන ලදී.

එබැවින් මා, මෙම වර්ෂයේ දී දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය වෙනුවෙන් සිය දායකත්වය කැප කළ කළමනාකරණ මණ්ඩලයේ, අධ්‍යයන මණ්ඩල, විශේෂඥ මණ්ඩල සාමාජිකයන්, පුහුණුකරුවන් සහ පරීක්ෂකවරුන් හට මාගේ කෘතඥතාව පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. එමෙන්ම 2022 වර්ෂය දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සඳහා ඉතා ඵලදායී වර්ෂයක් බවට පත් කිරීම වෙනුවෙන් ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී, සහකාර පුස්තකාලයාධිකාරී සහ දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අනෙකුත් කාර්ය මණ්ඩලයට ද මාගේ ස්තූතිය පළ කරන්නෙමි.

මහාචාර්ය ක්‍රිෂාන්ත අබේසේන

අධ්‍යක්ෂ
දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

වගු ලැයිස්තුව

වගුව 1	කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම් විස්තර	5
වගුව 2	මූල්‍ය කමිටුවේ රැස්වීම් විස්තර	7
වගුව 3	අධ්‍යයන මණ්ඩලවල රැස්වීම් විස්තර	7
වගුව 4	අධ්‍යයන මණ්ඩලවල සභාපතිවරු සහ ලේකම්වරු	8
වගුව 5	විශේෂඥ මණ්ඩලවල රැස්වීම් විස්තර	8
වගුව 6	විශේෂඥ මණ්ඩලවල සභාපතිවරු සහ ලේකම්වරු	9
වගුව 7	පුස්තකාල කමිටුවේ රැස්වීම් විස්තර	10
වගුව 8	දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට පුහුණුවන්නන් බඳවා ගැනීම	13
වගුව 9	දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මුළු පුහුණුවන්නන්	14
වගුව 10	දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව සහ වර්තමාන කාර්ය මණ්ඩලය	19

රූපසටහන් ලැයිස්තුව

රූපසටහන 1	ආයතනික ව්‍යුහය	4
රූපසටහන 2	2022 වර්ෂයේ පුහුණුවන්නන් බඳවා ගැනීම ස්ත්‍රී-පුරුෂභාවය අනුව	14
රූපසටහන 3	2022 දෙසැම්බර් 31 වැනි දිනට සිටින පුහුණුවන්නන්	15

කෙටි පද ලැයිස්තුව

PGIIM	දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
IIM	දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
GWUIM	ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විද්‍යා විශ්වවිද්‍යාලය
BIMARI	බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය
BOM	කළමනාකරණ මණ්ඩලය
BOS	අධ්‍යයන මණ්ඩලය
SpB	විශේෂඥ මණ්ඩල
MD	විශේෂඥ වෛද්‍ය උපාධිය
IQAC	අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ කේන්ද්‍රය

පළමු වැනි
කොටස
වාර්ෂික වාර්තාව 2022

1. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIIM)

1.1 කෙටි හැඳින්වීම

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIIM) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ 2017 දෙසැම්බර් 08 වැනි දිනැති, අංක 2048/46 දරණ දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය යටතේ කොළඹ විශ්වවිද්‍යාලයට අයත් ආයතනයක් ලෙස පිහිටුවා ඇති අධ්‍යාපන ආයතනයකි. ඒ අනුව මෙම ආයතනය සෞඛ්‍ය සේවා, විශ්වවිද්‍යාල සහ පෞද්ගලික අංශය සඳහා මානව සම්පත් අවශ්‍යතාවන් සපුරාලීම වෙනුවෙන් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. සෞඛ්‍ය ව්‍යවස්ථා සංග්‍රහයට අනුව සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ආයුර්වේද, සිද්ධ සහ යුනානි යන ප්‍රධාන ක්ෂේත්‍රවල විශේෂඥ වෛද්‍යවරු සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ආයුර්වේදය, යුනානි සහ සිද්ධ අධ්‍යාපනය සඳහා විශේෂඥයින් සැපයීම දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වගකීම වේ. ඒ අනුව දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය දිවයිනට අවශ්‍ය කරන ශ්‍රම බල අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය වන අධ්‍යයන පාඨමාලා ආරම්භ කිරීමට යෝග්‍ය පියවර ගෙන ඇත.

2019 පෙබරවාරි මස 25 වැනි දින කළමනාකරණ මණ්ඩලයේ පළමු වැනි රැස්වීම පැවැත්වීමෙන් පසුව දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මෙහෙයුම් කටයුතු 2019 මාර්තු මාසයේ දී ආරම්භ කරන ලදී. ආයතනය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ලබා දෙන තෙක් දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයට අයත් බොරැලලේ පිහිටි ආයුර්වේද ශික්ෂණ රෝහල තුළ තාවකාලික ගොඩනැගිල්ලක ස්ථාපනය කර ඇත.

වර්තමානයේ දී දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විශේෂඥ වෛද්‍ය ආයුර්වේද වැඩසටහන් පහක් සහ විශේෂඥ වෛද්‍ය යුනානි වැඩසටහන් එකක් ඇතුළුව විශේෂඥ වෛද්‍ය විද්‍යා උපාධි වැඩසටහන් හයක් පවත්වනු ලබයි. 2020 සහ 2021 වර්ෂවල දී මෙම උපාධි වැඩසටහන් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය හිමි විය. එමෙන්ම තවත් විශේෂඥ වෛද්‍ය උපාධි වැඩසටහන් හයක් (ආයුර්වේද වැඩසටහන් දෙකක්, සිද්ධ වැඩසටහන් දෙකක් සහ යුනානි වැඩසටහන් දෙකක්) සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය අපේක්ෂා කරනු ලැබේ. තව ද නව පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන් දෙකක් හඳුන්වාදීමට ද පියවර ගෙන ඇත.


දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ආයුර්වේද විශේෂඥ වෛද්‍ය උපාධිය සහ මණ්ඩල සහතිකකරණ වැඩසටහන්වල දෙවැනි ශිෂ්‍ය කණ්ඩායම සහ යුනානි විශේෂඥ වෛද්‍ය උපාධිය සහ මණ්ඩල සහතිකකරණ වැඩසටහනේ පළමු ශිෂ්‍ය කණ්ඩායම සඳහා ශිෂ්‍යයින් බඳවා ගත හැකි විය.

ආයතනය සිය අධ්‍යයන වැඩසටහන් සහ සාමාන්‍ය පරිපාලනය සම්බන්ධයෙන් ඉහළ ගුණාත්මකභාවයක් පවත්වා ගැනීම වෙනුවෙන් අවශ්‍ය සෑම පියවරක්ම ගනු ලැබේ. ඒ අනුව අධ්‍යයන සහ අනධ්‍යයන කටයුතුවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ දී අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ කේන්ද්‍රය ස්ථාපිත කරන ලදී. තව ද, දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ නියෝජිතයෙක් කොළඹ විශ්වවිද්‍යාලයේ තත්ත්ව සහතික මධ්‍යස්ථානයේ රැස්වීම්වලට සහභාගී වේ. එමෙන්ම දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විෂයමාලා සංවර්ධනය සහ ඇගයීම් කමිටුව සමඟ සහයෝගය ඇතිව දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ශිෂ්‍යයින්ගේ/ පුහුණුලාභීන්ගේ තෘප්තිමත්භාවය මැනීම සඳහා සමීක්ෂණයක් පැවැත්වීම සඳහා වූ කටයුතු ආරම්භ කරන ලද අතර මෙයට අමතරව දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුහුණුකරුවන්ගේ සහ අනෙකුත් සම්පත්දායකයින්ගේ තෘප්තිමත්භාවය මැනීම සඳහා ද පියවර ගැනීමට නියමිතය.

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය එහි පාර්ශ්වකරුවන් වෙනුවෙන් වඩාත් විශිෂ්ට සේවාවක් ලබා දීම පිණිස සමාජයේ අවශ්‍යතාවන් පිළිබඳව සෑමවිටම සැලකිලිමත් වේ. ඒ අනුව, දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය දේශීය වෛද්‍ය අංශයේ සේවයේ නිරත වෛද්‍ය නිලධාරීන් අතර දේශීය වෛද්‍ය විද්‍යාව සම්බන්ධයෙන් ඇති පශ්චාත් උපාධි පුහුණු අවශ්‍යතාවන් හඳුනා ගැනීම සඳහා විෂයමාලා සංවර්ධනය සහ ඇගයීම් කමිටුවේ ද සහයෝගය ඇතිව වෙළඳපොළ සමීක්ෂණයක් පැවැත්වීමට පියවර ගෙන ඇත.

ඒ හා සමගාමීව, ශිෂ්‍යයින් සඳහා වඩාත් හිතකර ඉගෙනුම් පරිසරයක් ලබාදීම පිණිස දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ යටිතලපහසුකම් සංවර්ධනය සඳහා පියවර ගෙන ඇත. ඉහත ඉලක්කය සාක්ෂාත් කර ගනු පිණිස පුස්තකාලය සඳහා භාවිතා කරන ප්‍රදේශය නවීකරණය කිරීම සහ යන්ත්‍රෝපකරණ ප්‍රසම්පාදනය සිදු කරන ලදී. ඒ අනුව, 2022 නොවැම්බර් මාසයේ දී දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුස්තකාලය විවෘත කරන ලද අතර මේ වන විට දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් එහි අභ්‍යාසලාභීන් සහ පුහුණුකරුවන් සඳහා වඩාත් සංවිධානාත්මක ආකාරයකින් පුස්තකාල පහසුකම් ලබා දෙනු ලබයි. පුස්තකාල සේවා හඳුන්වාදීම පිණිස සමාලෝචිත වර්ෂය තුළ දී ආයුර්වේදය විෂය සම්බන්ධයෙන් මාතෘකා 144ක් යටතේ සහ යුනානි විෂය සම්බන්ධයෙන් මාතෘකා 81ක් යටතේ පුස්තකාල පොත් 225ක් මිල දී ගන්නා ලදී.

ආයතනයේ මානව සම්පත් ශක්තිමත් කිරීම පිණිස 2022 වර්ෂයේ දී කළමනාකරණ සහකාරවරුන් දෙදෙනෙක් බඳවා ගන්නා ලදී. එමෙන්ම එක් කළමනාකරණ සහකාරවරියක් වෙනත් විශ්වවිද්‍යාලයකින් දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට ස්ථාන මාරු කරන ලදී. වර්තමානය වන විට දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මුළු ස්ථිර කාර්ය මණ්ඩලය නමයක් (09) වේ. බහුකාර්ය සංවර්ධන කාර්යසාධක දෙපාර්තමේන්තුවෙන් කාර්යාල වැඩ සහායක නිලධාරීන් දෙදෙනෙක් තාවකාලික පදනම මත මෙම ආයතනයට වෙන් කර ඇත.



රූපසටහන 1- ආයතනික ව්‍යුහය

1.2 ආයතනයේ අධ්‍යක්ෂවරයා

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා ආයතනයේ අධ්‍යක්ෂවරයා වේ.

මහාචාර්ය ක්‍රිෂාන්ත අබේසේන මහතා 2022 වසරේ දී දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂවරයා ලෙස සේවය කරන ලදී.

1.3 කළමනාකරණ මණ්ඩලය (BOM)

කළමනාකරණ මණ්ඩලය (BOM) දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ප්‍රධාන විධායක සහ අධ්‍යයන මණ්ඩලය වන අතර සෑම මාසයක දීම එහි රැස්වීම් පවත්වනු ලැබේ. 2022 වර්ෂය තුළ දී දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ (සාමාන්‍ය සහ විශේෂ) රැස්වීම් 10ක් පවත්වන ලදී.

රැස්වීම් අංක,රැස්වීම් දින සහ සහභාගීවීම් පිළිබඳ වාර්තා පහත දක්වා ඇත.

රැස්වීම් අංකය	රැස්වීම් දිනය	සහභාගී වූ සාමාජිකයන් සංඛ්‍යාව	සහභාගී නොවීමට හේතු ඉදිරිපත් කළ	සහභාගී නොවූ සංඛ්‍යාව
25 වැනි රැස්වීම	2022.01.21	15	02	01
26 වැනි රැස්වීම	2022.02.18	17	-	01
27 වැනි රැස්වීම	2022.04.22	14	01	04
28 වැනි රැස්වීම	2022.05.20	15	01	03
29 වැනි රැස්වීම	2022.06.17	16	-	02
30 වැනි රැස්වීම	2022.07.15	14	02	02
31 වැනි රැස්වීම	2022.08.19	13	01	04
32 වැනි රැස්වීම	2022.09.16	15	-	02
33 වැනි රැස්වීම	2022.10.21	16	02	01
34 වැනි රැස්වීම	2022.12.16	14	04	01

වගුව - 1

සමාලෝචිත වර්ෂය තුළ දී පහත දැක්වෙන සාමාජිකයින් කළමනාකරණ මණ්ඩලයට ඇතුළත් විය.

නිල බලයෙන් පත් වන නිලධාරීන්

මහා. ක්‍රිෂාන්ත අබේසේන — අධ්‍යක්ෂ – දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

නම් කළ නිලධාරී / උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්

එම්. එම්. ක්‍රිෂාන්ති මෙය

එම්. එච්. ටී. ටී. තුෂාරා මිය — 2022.10.21 සිට ක්‍රියාත්මක වන පරිදි

නම් කළ නිලධාරී / දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ලේකම්

ගීතාමණී කරුණාරත්න මෙය

නම් කළ නිලධාරී / මුදල් අමාත්‍යාංශ ලේකම්

හර්ෂනී ප්‍රනාන්දු මෙය

ඊ. ඒ. රත්නසීල මහතා — 2022.04.22 සිට ක්‍රියාත්මක වන පරිදි

ආයුර්වේද කොමසාරිස්

වෛද්‍ය ධම්මික අබේගුණවර්ධනය මහතා

කලින් හිටපු අධ්‍යක්ෂ

මහාචාර්ය ජයන්ත ජයවර්ධන මහතා

අධ්‍යක්ෂ, දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය

මහාචාර්ය පී. ඒ. පරණගම මහත්මිය

ප්‍රධානී, සිද්ධ වෛද්‍ය අංශය, යාපනය විශ්වවිද්‍යාලය

වෛද්‍ය තයාලිනී තිලීපන් මහත්මිය

වෛද්‍ය විවියන් සතියසීලන් මහත්මිය — 2022.10.21 සිට ක්‍රියාත්මක වන පරිදි

ප්‍රධානී, සිද්ධ වෛද්‍ය අංශය, ත්‍රීකුණාමලය මණ්ඩපය

වෛද්‍ය වී. අනවරතන් මහතා — 2022.04.22 සිට ක්‍රියාත්මක වන පරිදි

අධ්‍යක්ෂ - බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණ ආයතනය

වෛද්‍ය ස්වර්ණ කලුතොටගේ මහත්මිය- වැඩ බලන අධ්‍යක්ෂ/BIM

විශේෂඥ ශ්‍රේණියේ වෛද්‍ය (ආයුර්වේද)

වෛද්‍ය ටී. කේ. ජී. පුංචිහේවා මහත්මිය

විශේෂඥ ශ්‍රේණියේ වෛද්‍ය (සිද්ධ)

වෛද්‍ය එස්. වර්ණකුලේන්ද්‍රන් මහත්මිය

විශේෂඥ ශ්‍රේණියේ වෛද්‍ය (යුනානි)

වෛද්‍ය ඒ. ජී. එෆ්. නජීයා මහත්මිය

වි.ප්‍ර.කො.ස. පත් කළ සාමාජිකයින්

ටී. ධරමරාජා මහතා

එස්. ඩී. ඩබ්. සමන් දියගහ වඩුගේ මහතා

කේ. කේ. සමින්ද ප්‍රියංග කෝණාර මහතා

වෛද්‍ය ඩබ්. ඒ. එල්. චන්ද්‍රසිරි වැලිවිට මහතා

පාලක සභාව නම් කළ නිලධාරී

වෛද්‍ය එස්. සෙල්ලයියා මහතා

ජේ. එම්. යූ. ජයසේකර මහතා

1.4 මූල්‍ය කමිටුව

සමාලෝචිත වර්ෂය තුළ දී මූල්‍ය කමිටුවට පහත දැක්වෙන සාමාජිකයන් ඇතුළත් විය.

මහාචාර්ය ක්‍රිෂාන්ත අබේසේන මහතා	- අධ්‍යක්ෂ, දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
මහාචාර්ය පී. ඒ. පරණගම මහත්මිය	- අධ්‍යක්ෂ, දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
ටී. ධර්මරාජා මහතා	- වි.ප්‍ර.කොෂ. පත් කළ කළමනාකරණ මණ්ඩල සාමාජික
හර්ෂනී ප්‍රනාන්දු මෙය	- භාණ්ඩාගාර නියෝජිත 2021.05.22 සිට 2022.02.05 දක්වා
ඊ. ඒ. රත්නසිල මහතා	- 2022.02.06 සිට ක්‍රියාත්මක වන පරිදි

රැස්වීම් සංඛ්‍යාව, රැස්වීම් දින සහ සහභාගීවූවන්ගේ වාර්තා පහත දක්වා ඇත.

රැස්වීම් අංකය	රැස්වීම් දිනය	සහභාගී වූ සාමාජිකයින් සංඛ්‍යාව	නොපැමිණීමට කරුණු ඉදිරිපත් කළ	නොපැමිණි
09 වැනි රැස්වීම	02.02.2022	04	-	-
10 වැනි රැස්වීම	11.07.2022	03	-	01
11 වැනි රැස්වීම	12.09.2022	04	-	-
12 වැනි රැස්වීම	11.11.2022	03	-	01

වගුව – 2

1.5 අධ්‍යයන මණ්ඩල

අධ්‍යයන කටයුතු, පුහුණු වැඩසටහන් සහ විභාග පිළිබඳ තීරණ කොළඹ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලයේ සහ සනාතන සභාවේ අනුමැතියට යටත්ව, අධ්‍යයන මණ්ඩල (BOS) සහ විශේෂඥ මණ්ඩල (SpB) මඟින් ගනු ලැබේ. අධ්‍යයන මණ්ඩල (BOS) සහ විශේෂඥ මණ්ඩලවල රැස්වීම් මාසයකට වරක් පවත්වනු ලැබේ.

1.5.1 අධ්‍යයන මණ්ඩල

අධ්‍යයන මණ්ඩල ලැයිස්තුව

ආයුර්වේද අධ්‍යයන මණ්ඩලය
සිද්ධ අධ්‍යයන මණ්ඩලය
යුනානි අධ්‍යයන මණ්ඩලය

2022 වර්ෂයේ දී පවත්වන ලද අධ්‍යයන මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව

මණ්ඩලයේ නම	පැවැත් වූ රැස්වීම් සංඛ්‍යාව
ආයුර්වේද	11
සිද්ධ	05
යුනානි	10

වගුව - 3

අධ්‍යයන මණ්ඩලවල සභාපති සහ ලේකම් ධුරයන් – 2022

අධ්‍යයන මණ්ඩලය	සභාපති	ලේකම්
ආයුර්වේද	වෛද්‍ය එස්. ඩී. හපුආරච්චි මිය	වෛද්‍ය පී. ආර්. වරාතැන්න මිය
සිද්ධ	වෛද්‍ය එන්. වර්නකුලේන්ද්‍රන් මහතා	වෛද්‍ය කේ. සෞන්දරාජන් මිය
යුනානි	මහාචාර්ය එම්. එස්. එම්. ෂිෆා මහතා	මහාචාර්ය එම්. යූ. ඉසෙඩ්. එන්. ෆර්ෂානා මිය

වගුව - 4

1.5.2 විශේෂඥ මණ්ඩල

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය තුළ ආයුර්වේද, සිද්ධ සහ යුනානි යන විෂයන් සඳහා විශේෂඥ මණ්ඩල 12ක් ඇත.

විශේෂඥ මණ්ඩල ලැයිස්තුව

ආයුර්වේද
කෞමාරභෘතය පිළිබඳ විශේෂඥ මණ්ඩලය
කායචිකිත්සා පිළිබඳ විශේෂඥ මණ්ඩලය
ප්‍රසූතිතන්ත්‍ර පිළිබඳ විශේෂඥ මණ්ඩලය
ශල්‍යතන්ත්‍ර පිළිබඳ විශේෂඥ මණ්ඩලය
ස්වස්තවෘත පිළිබඳ විශේෂඥ මණ්ඩලය
භයිසජ්‍ය කල්පන සහ රාසශාස්ත්‍ර පිළිබඳ විශේෂඥ මණ්ඩලය
ශාලක්‍ය පිළිබඳ විශේෂඥ මණ්ඩලය

සිද්ධ
ගුණපාඩම් පිළිබඳ විශේෂඥ මණ්ඩලය
මරුතුවම් පිළිබඳ විශේෂඥ මණ්ඩලය

යුනානි
මෞලිජාත් පිළිබඳ විශේෂඥ මණ්ඩලය
ඉල්මුල් අද්වියා පිළිබඳ විශේෂඥ මණ්ඩලය
අම්රාස් ඊ නිස්වාන් වා කුවාබලාත් පිළිබඳ විශේෂඥ මණ්ඩලය

2022 වර්ෂයේ දී පවත්වන ලද විශේෂඥ මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව

මණ්ඩලයේ නම	පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව
ආයුර්වේද	
භයිසජ්‍ය කල්පන සහ රසශාස්ත්‍ර	5
කෞමාරභෘතය	9
කායචිකිත්සා	6
ප්‍රසූතිතන්ත්‍ර	9
ශල්‍යතන්ත්‍ර	9
ස්වස්තවෘත	9
ශාලක්‍ය	6

සිද්ධ	
ගුණපාඩම්	04
මරුතුවම්	04
යුනානි	
මෝලිජාත්	08
ඉල්මුල් අද්වියා	01
අම්රාස් ඊ නිස්වාන්	01

වගුව - 5

විශේෂඥ මණ්ඩලවල සභාපති සහ ලේකම් ධුරයන් – 2022

විශේෂඥ මණ්ඩලය	සභාපති	ලේකම්
ආයුර්වේද		
කෞමාරභෘතය	වෛද්‍ය අයි.ඒ.එම්. ලීනා මිය	වෛද්‍ය ඕ.ටී.එම්.ආර්.කේ.එස්. කලවාන මිය
කායචිකිත්සා	වෛද්‍ය ටී. කේ. ජී. පුංචිහේවා මිය	වෛද්‍ය ඊ. ඩී. ටී. පී. ගුණරත්න මිය
ප්‍රසූතිතන්ත්‍ර	වෛද්‍ය කේ.පී.කේ.ආර්. කරුනාගොඩ මිය	වෛද්‍ය එච්. එල්. එම්. ජී. සංජීවනී මිය
ශල්‍යතන්ත්‍ර	වෛද්‍ය කේ. සී. පී. ගුණරත්න මිය	වෛද්‍ය කේ.කේ.වී.එස්. පේෂලා මිය
ස්වස්තවෘත	වෛද්‍ය ඩබ්. එම්. එස්. එස්. කේ. කුලතුංග මිය	වෛද්‍ය අයි. ඒ. එම්. ලීනා මිය
භයිසජ්‍ය කල්පන	වෛද්‍ය එස්.කේ.එම්.කේ. හැරපත්දෙනිය මිය	වෛද්‍ය එම්. වී. ආර්. විජයන්තිමාලා මිය
ශාලාක්‍යතන්ත්‍ර	මහාචාර්ය කේ. පී. පී. පීරිස් මිය	වෛද්‍ය ආර්. එල්. වයි. යූ. රත්නායක මිය
සිද්ධ		
ගුණපාඩම්	වෛද්‍ය වී. සතියසීලන් මිය	වෛද්‍ය කනගසුන්දරම් මයා
මරුතුවම්	වෛද්‍ය ඒ. ශ්‍රීතරන් මිය	වෛද්‍ය එස්. වර්නකුලේන්ද්‍රන් මිය
යුනානි		
මෝලිජාත්	වෛද්‍ය එම්. එච්. එම්. හෆීල් මහතා	වෛද්‍ය ඒ. එල්. එම්. ඉෂාන් මහතා
ඉල්මුල් අද්වියා	මහාචාර්ය එන්. ෆහාමියා මිය	වෛද්‍ය බී. අයි. නිහාරා මිය
අම්රාස් ඊ නිස්වාන්	මහාචාර්ය එම්.යූ.ඉසෙඩ්.එන්. ෆර්සානා මිය	වෛද්‍ය ජේ. රුම්සියා මිය

වගුව - 6

1.6 පුස්තකාල කමිටුව

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සඳහා පුස්තකාලයක් ස්ථාපිත කිරීම සහ පුස්තකාල කටයුතු සඳහා අවශ්‍ය නිර්දේශ ලබා ගැනීම පිණිස 2021 වර්ෂයේ දී පුස්තකාල කමිටුවක් පිහිටුවන ලදී.

2022.12.31 වැනි දින විට පහත දැක්වෙන සාමාජිකයින් පුස්තකාල කමිටුවේ සේවය කරන ලදී.
කමිටුවට පහත දැක්වෙන සාමාජිකයින් ඇතුළත් වේ.

මහාචාර්ය ක්‍රිෂාන්ත අබේසේන මහතා - අධ්‍යක්ෂ / දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
මහාචාර්ය ආර්. එස්. ජයවර්ධන මහතා - අධ්‍යයන මණ්ඩලයේ නියෝජිත/ ආයුර්වේද
වෛද්‍ය එම්. එස්. එස්. ෆවුමියා මිය - අධ්‍යයන මණ්ඩලයේ නියෝජිත /යුනානි
වෛද්‍ය ආර්. ඩී. ආනන්ද තිස්ස මහතා - ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති - ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විද්‍යා විශ්වවිද්‍යාලය
වෛද්‍ය සී. ආර්. ගමගේ මිය – ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති – දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
වෛද්‍ය දිල්හානි මුණසිංහ මිය - ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති - වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
ලක්මිණී මාරසිංහ මිය - ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති – වෛද්‍ය පීඨය, කැළණිය විශ්වවිද්‍යාලය

රැස්වීම් සංඛ්‍යාව, රැස්වීම් දින සහ සහභාගීවීම් වාර්තා පහත දක්වා ඇත.

රැස්වීම් සංඛ්‍යාව	**රැස්වීම් දිනය**	**සහභාගී වූ සාමාජිකයින් සංඛ්‍යාව**	**නොපැමිණීමට කරුණු ඉදිරිපත් කළ**	**නොපැමිණි**
05	03/02/2022	08	-	02

වගුව - 7

1.7 විෂයමාලා සංවර්ධනය සහ ඇගයීම් කමිටුව (CDEC)
විෂයමාලා සංවර්ධනය සහ ඇගයීම් කමිටුව පහත දැක්වෙන කාර්යයන් ඉටුකරවා ගැනීම පිණිස 2020 වර්ෂයේ දී ස්ථාපිත කරන ලදී.

- විෂයමාලා සංවර්ධනය ආරම්භ කිරීම, විෂයමාලා ඇගයීම, සහ කළමනාකරණ මණ්ඩලයට විෂයමාලා නිර්දේශ කිරීම
- අධ්‍යයන කරුණු සහ විභාග සම්බන්ධ මාර්ගෝපදේශ සහ ලේඛන ඇගයීම සහ එම ලේඛන කළමනාකරණ මණ්ඩලයට නිර්දේශ කිරීම

කමිටුවට පහත දැක්වෙන සාමාජිකයින් ඇතුළත් වේ.

1. මහාචාර්ය ක්‍රිෂාන්ත අබේසේන මහතා - අධ්‍යක්ෂ -දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
2. මහාචාර්ය ප්‍රියානි පිරිස් මහත්මිය (සභාපති) – මහාචාර්ය - ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විද්‍යා විශ්වවිද්‍යාලය
3. මහාචාර්ය ආර්. ඩී. එච්. කුලතුංග මිය – මහාචාර්ය - දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
4. මහාචාර්ය එස්. පී. මොල්ලිගොඩ මිය - මහාචාර්ය - දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
5. වෛද්‍ය ඕ. ටී. එම්. ආර්. කේ. එස්. බී. කලවාන මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
6. වෛද්‍ය . කේ.කේ. වී. එස්. පේෂලා මිය - කථිකාචාර්ය - දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
7. වෛද්‍ය පුෂ්පා ජයකොඩි මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය – ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විද්‍යා විශ්වවිද්‍යාලය
8. වෛද්‍ය ඒ. එච්. ඒ. ෆසීනා මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
9. වෛද්‍ය එන්. වර්නකුලේන්ද්‍රන් මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - ත්‍රිකුණාමලය මණ්ඩපය
10. මහාචාර්ය මාධව නිලුපති චන්ද්‍රතිලක මහතා - කැළණිය විශ්වවිද්‍යාලය
11. වෛද්‍ය වාසනා ජයරත්න මිය -වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳ විශේෂඥ

විෂයමාලා සංවර්ධනය සහ ඇගයීම් කමිටුව 2022 වර්ෂයේ දී පහත දැක්වෙන ලේඛන සකස් කරන ලද අතර කොළඹ විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ අනුමැතිය ලබා ගන්නා ලදී.

- විදේශීය විශේෂ වෛද්‍ය (ආයුර්වේද, යුනානි සහ සිද්ධ) උපාධිධාරීන් සඳහා ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරී පුහුණුව.
- විශේෂ වෛද්‍ය (ආයුර්වේද, යුනානි සහ සිද්ධ) පිටවීම් විභාගයේ බාහිර විභාග පරීක්ෂකයින් සඳහා මාර්ගෝපදේශ
- පරීක්ෂකයින් සඳහා වූ රහස්‍යභාවය සහ බැඳියා පිළිගැටුම් ප්‍රකාශනය සහ අභියෝජනාව.
- පර්යේෂණ ක්‍රමවේදය සහ උපාධි නිබන්ධන මොඩියුලය
- වෘත්තීයභාවය සහ ආචාර්ධර්ම මොඩියුලය

ඉහත කාර්යයන්ට අමතරව විෂයමාලා සංවර්ධනය සහ ඇගයීම් කමිටුව දේශීය වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳ පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතාවන් හඳුනා ගැනීම සඳහා වූ වෙළඳපොළ සමීක්ෂණයේ සහ ශිෂ්‍යයින්ගේ තෘප්තිමත්වීම පිළිබඳ සමීක්ෂණයේ දත්ත එක්රැස් කිරීම සඳහා වූ ප්‍රශ්නාවලි සකස් කිරීම සඳහා ද සහභාගී විය. තව ද විෂයමාලා සංවර්ධනය සහ ඇගයීම් කමිටුව දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කාර්යපටිපාටිය විධිමත් කිරීම පිණිස එම ආයතනයේ සාමාන්‍ය රෙගුලාසි සංශෝධනය කිරීම සම්බන්ධයෙන් ද නිරතව සිටී.

1.8 අන්තර්ජාතික සහයෝගීතාව සඳහා වූ කමිටුව (CIC)

අන්තර්ජාතික සහයෝගීතාව සඳහා වූ කමිටුව දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යාපනය වැඩිදියුණු කිරීම සඳහා අනෙකුත් රටවල් සමඟ සහයෝගීතාවන් ඇති කර ගැනීමේ ක්‍රියාවලිය වේගවත් කරවීමේ පරමාර්ථය ඇතිව ස්ථාපිත කරන ලදී. වර්තමානයේ සිටින විශේෂඥ වෛද්‍ය උපාධි හදාරන පුහුණුවන්නන්ගේ පශ්චාත් විශේෂඥ වෛද්‍ය උපාධි පුහුණුවීම් සඳහා ඉඩ ප්‍රස්ථා නිර්මාණය කිරීම කමිටුව ආරම්භයේ දී ඇති ප්‍රධාන ඉලක්කය වේ.

කමිටුවට පහත දැක්වෙන සාමාජිකයින් ඇතුළත් වේ.

1. මහාචාර්ය ක්‍රිෂාන්ත අබේසේන මහතා (අධ්‍යක්ෂ)
2. වෛද්‍ය බී. එම්. එස්. අමරජීව මිය(සභාපති)
3. මහාචාර්ය ප්‍රියානි පීරිස් මිය - මහාචාර්ය – ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විද්‍යා විශ්වවිද්‍යාලය
4. මහාචාර්ය ආර්. ඩී. එච්. කුලතුංග මිය - මහාචාර්ය - දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
5. වෛද්‍ය ටී. වීරරත්න මහතා
6. වෛද්‍ය කේ. පී. කේ. ආර්. කරුනාගොඩ මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
7. වෛද්‍ය අයි. ඒ. එම්. ලීනා මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
8. වෛද්‍ය කේ. කේ. වී. එස්. පේෂලා මිය - කථිකාචාර්ය – දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය

අන්තර්ජාතික සහයෝගීතාව සඳහා වූ කමිටුව දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අභ්‍යාසලාභීන් සඳහා පුහුණු අවස්ථා ලබාදීම පිණිස දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සහ ඉන්දියාවේ ප්‍රමුඛ විශ්වවිද්‍යාල අතර සහයෝගීතාවන් ඇති කර ගැනීම සඳහා ශ්‍රී ලංකා ආණ්ඩුව සහ ඉන්දියාවේ ආයුෂ් අමාත්‍යාංශය අතර අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු සිදු කරනු ලබයි. මේ පිළිබඳ වූ යෝජනාව කෙටුම්පත් කරන ලද අතර එය කොළඹ විශ්වවිද්‍යාලයේ සනාථන සභාව සහ පාලක මණ්ඩලය මඟින් නිර්දේශ කර අනුමත කරන ලදී.

1.9 අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ කේන්ද්‍රය (IQAC)

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ කේන්ද්‍රය (IQAC-PGIIM) රාජ්‍ය විශ්වවිද්‍යාල සඳහා වූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2014 වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා මාර්ගෝපදේශවලට අනුකූලව කොළඹ විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර තත්ත්ව සහතික ඒකකයේ නියෝග යටතේ 2022 වර්ෂයේ දී ස්ථාපිත කරනු ලැබීය. IQAC- PGIIM නිසි අධිකාරිය මඟින් අනුමත කර ඇති තත්ත්ව සහතික ප්‍රතිපත්ති රාමුව සහ අනු-නීති අනුගමනය කරනු ලබයි.

IQAC මඟින් උසස් ගුණාත්මක සේවාවක් ලබාදීම පිණිස අධ්‍යයන කාර්ය මණ්ඩලය, පරිපාලන කාර්ය මණ්ඩලය, අනධ්‍යයන කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයින් ඇතුළු පාර්ශවකරුවන් රාශියකගේ සහභාගීත්වයෙන් ශක්තිමත් ආයතනයකි. ප්‍රතිපත්ති සහ කාර්යපටිපාටි සකස් කිරීම සහ ප්‍රගතිය අධීක්ෂණය කිරීම මඟින් ආයතනය පිරිනමන වැඩසටහන්වල ගුණාත්මකභාවය සහ ප්‍රමිති සහතික කිරීම මෙම කුටියේ ප්‍රධානතම කාර්යභාරය වේ.

කමිටුවට පහත දැක්වෙන සාමාජිකයින් ඇතුළත් වේ.

1. මහාචාර්ය ක්‍රිෂාන්ත අබේසේන මහතා - අධ්‍යක්ෂ / දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
2. වෛද්‍ය බී. උදයනන් මිය – ත්‍රිකුණාමලය මණ්ඩපය (සම්බන්ධීකරණ නිලධාරී- IQAC/PGIIM)
3. මහාචාර්ය කේ. පී. පී. පීරිස් මිය - ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විද්‍යා විශ්වවිද්‍යාලය
4. වෛද්‍ය අයි. ඒ. එම්. ලීනා මිය - දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
5. වෛද්‍ය වයි. ඒ. යූ. ඩී. කරුණාරත්න මිය - දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
6. වෛද්‍ය බී. එම්. එස්. අමරජීව මිය - දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
7. වෛද්‍ය ඩබ්. එම්. එස්. එස්. කේ. කුලතුංග මිය – දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
8. වෛද්‍ය කේ. කේ. වී. එස්. පේෂලා මිය – දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
9. මහාචාර්ය එම්. යූ. ඉසෙඩ්. එන්. ෆර්සානා මිය – දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
10. වෛද්‍ය එම්. එච්. එම්. හෆීල් මහතා – දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
11. මහාචාර්ය එන්. ෆහාමියා මිය - දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
12. වෛද්‍ය වී. සතියසීලන් මිය– යාපනය විශ්වවිද්‍යාලය
13. ඩබ්.එන්.පී.එම්.එන්.එන්. කරුණාරත්න මිය - ජ්‍යෙෂඨ සහකාර ලේඛකාධිකාරී -දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
14. එස්. කේ. රුද්‍රිගු මහතා - ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී- දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
15. ඩී. ජී. ආර්. එල්. ගුණරත්න මහතා - සහකාර පුස්තකාලයාධිකාරී-දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (කැඳවුම්කරු/IQAC)

2. 2022 වර්ෂය තුළ අධ්‍යයන කටයුතු

2.1 දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සඳහා පුහුණුවන්නන් බඳවා ගැනීම


දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සඳහා පුහුණුවන්නන් බඳවා ගැනීම පිළිබඳ විස්තර පහත දැක්වෙන වගුවෙන් දැක් වේ.

වැඩසටහනේ නම	***2022 ශිෂ්‍ය බඳවා ගැනීම***	
	පුරුෂ	**ස්ත්‍රී**
ආයුර්වේද කෞමාරභෘතය පිළිබඳ විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධිය සහ අධ්‍යයන මණ්ඩල සහතිකය	***-***	***2***
ආයුර්වේද කායචිකිත්සා පිළිබඳ විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධිය සහ අධ්‍යයන මණ්ඩල සහතිකය	***1***	***3****
ආයුර්වේද ප්‍රසූතිතන්ත්‍ර සහ ස්ත්‍රී රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධිය සහ අධ්‍යයන මණ්ඩල සහතිකය	***-***	***2***
ආයුර්වේද ශල්‍යතන්ත්‍ර පිළිබඳ විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධිය සහ අධ්‍යයන මණ්ඩල සහතිකය	***-***	**1**
ආයුර්වේද ස්වස්තවෘත පිළිබඳ විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධිය සහ අධ්‍යයන මණ්ඩල සහතිකය	***-***	***-***
යුනානි මෝලිජාත් පිළිබඳ විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධිය සහ අධ්‍යයන මණ්ඩල සහතිකය	***1***	***1***
එකතුව	***2***	***9***

වගුව – 8

**(කායචිකිත්සා) *1වැනි ශිෂ්‍ය කණ්ඩායමේ සිටි අභ්‍යාසලාභියෙක් 2022 වර්ෂයේ දී ආයුර්වේද කායචිකිත්සාව පිළිබඳ විශේෂඥ වෛද්‍ය උපාධි සහ මණ්ඩල සහතිකකරණ වැඩසටහනේ දෙවන කණ්ඩායමට නැවත බැඳුනි.*

2022 වර්ෂයේ පුහුණුවන්නන් බඳවා ගැනීම ස්ත්‍රී පුරුෂභාවය අනුව.



රූපසටහන - *2*

2.2 දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුහුණුවන්නන්


2022 දෙසැම්බර් මස 31 වැනි දින වන විට දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුහුණුවන්නන් 32ක් වේ. 2021 සහ 2022 වර්ෂවල දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුහුණුවන්නන් පිළිබඳ විස්තරය පහත දැක්වෙන වගුව මඟින් දැක් වේ.

වැඩසටහනේ නම	*2021 දෙසැම්බර් 31 වැනි දිනට ශිෂ්‍ය ප්‍රජාව*		එකතුව	*2022 දෙසැම්බර් 31 වැනි දිනට ශිෂ්‍ය ප්‍රජාව*		එකතුව
	පුරුෂ	ස්ත්‍රී		පුරුෂ	ස්ත්‍රී	
ආයුර්වේද කෞමාරභෘතය පිළිබඳ විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධිය සහ අධ්‍යයන මණ්ඩල සහතිකය	*1*	*1*	*2*	*1*	*3*	*4*
ආයුර්වේද කායචිකිත්සා පිළිබඳ විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධිය සහ අධ්‍යයන මණ්ඩල සහතිකය	*5*	*8*	*13*	*6*	*11*	*17*
ආයුර්වේද ප්‍රසූතිතන්ත්‍ර සහ ස්ත්‍රී රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධිය සහ අධ්‍යයන මණ්ඩල සහතිකය	-	*2*	2	-	*4*	*4*
ආයුර්වේද ශල්‍යතන්ත්‍ර පිළිබඳ විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධිය සහ අධ්‍යයන මණ්ඩල සහතිකය	*1*	-	*1*	*1*	1	*2*
ආයුර්වේද ස්වස්තවෘත පිළිබඳ විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධිය සහ අධ්‍යයන මණ්ඩල සහතිකය	-	*3*	3	-	*3*	*3*
යුනානි මෝලිජාත් පිළිබඳ විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධිය සහ අධ්‍යයන මණ්ඩල සහතිකය	-	-	-	*1*	*1*	*2*
එකතුව	*7*	*14*	*21*	*9*	*23*	*32*

වගුව – 9

**(කායචිකිත්සා) 1වැනි ශිෂ්‍ය කණ්ඩායමේ සිටි අභ්‍යාසලාභියෙක් 2022 වර්ෂයේ දී ආයුර්වේද කායචිකිත්සාව පිළිබඳ විශේෂඥ වෛද්‍ය උපාධි සහ මණ්ඩල සහතිකකරණ වැඩසටහනෙන් දෙවන කණ්ඩායමට නැවත බැඳුනි.*

2022 දෙසැම්බර් 31වැනි දිනට පුහුණුවන්නන්



රූපසටහන - *3*

2.3 විශේෂඥ වෛද්‍ය උපාධි වැඩසටහන් අනුමත කිරීම

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය පහත දැක්වෙන විශේෂඥ වෛද්‍ය උපාධි වැඩසටහන් වෙනුවෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා අයැදුම්පත්‍ර ඉදිරිපත් කර ඇත.

1. ආයුර්වේද භයිසජ්‍යකල්පන සහ රාසශාස්ත්‍ර පිළිබඳ විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධිය සහ අධ්‍යයන මණ්ඩල සහතිකය
2. ආයුර්වේද ශාලක්‍යතන්ත්‍ර පිළිබඳ විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධිය සහ අධ්‍යයන මණ්ඩල සහතිකය
3. යුනානි ඉල්මුල් අද්වියා පිළිබඳ විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධිය සහ අධ්‍යයන මණ්ඩල සහතිකය
4. යුනානි අම්රාස් ඊ නිස්වාන් පිළිබඳ විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධිය සහ අධ්‍යයන මණ්ඩල සහතිකය
5. සිද්ධ ගුණපාඩම් පිළිබඳ විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධිය සහ අධ්‍යයන මණ්ඩල සහතිකය
6. සිද්ධ මරුතුවම් පිළිබඳ විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධිය සහ අධ්‍යයන මණ්ඩල සහතිකය

2.4 ආයුර්වේද විශේෂඥ වෛද්‍ය උපාධිය සහ මණ්ඩල සහතිකකරණ වැඩසටහන්.

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන කටයුතු 2022 වර්ෂයේ දී අඛණ්ඩව සිදු කරන ලදී. සියලුම අභ්‍යාසලාභීන් ඔවුන් සඳහා වෙන් කළ පුහුණු මධ්‍යස්ථානවල දී විශේෂඥ වෛද්‍ය උපාධි පුහුණු වැඩසටහන්වලට සහභාගී වූහ. සමාලෝචිත වර්ෂයේ දී දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් පහත දැක්වෙන ආයුර්වේදය පිළිබඳ විශේෂඥ වෛද්‍ය උපාධි සහ සහතිකකරණ වැඩසටහන් පවත්වන ලදී.

1. ආයුර්වේද කෞමාරභෘතය පිළිබඳ විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධිය සහ අධ්‍යයන මණ්ඩල සහතිකය
2. ආයුර්වේද කායචිකිත්සා පිළිබඳ විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධිය සහ අධ්‍යයන මණ්ඩල සහතිකය
3. ආයුර්වේද ප්‍රසූතිතන්ත්‍ර සහ ස්ත්‍රී රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධිය සහ අධ්‍යයන මණ්ඩල සහතිකය
4. ආයුර්වේද ශල්‍යතන්ත්‍ර පිළිබඳ විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධිය සහ අධ්‍යයන මණ්ඩල සහතිකය
5. ආයුර්වේද ස්වස්තවෘත පිළිබඳ විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධිය සහ අධ්‍යයන මණ්ඩල සහතිකය

2.5 යුනානි විශේෂඥ වෛද්‍ය උපාධිය සහ මණ්ඩල සහතිකකරණ වැඩසටහන්.

පුහුණුවන්නන් ලියාපදිංචි කිරීම පිළිබඳ විස්තර

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ *යුනානි විශේෂඥ වෛද්‍ය උපාධිය සහ මණ්ඩල සහතිකකරණ වැඩසටහනේ පළමු වැනි පුහුණුවන්නන් කණ්ඩායම 2022 වර්ෂයේ දී ආරම්භ කරන ලද අතර ඒ අනුව* මෝලිජාත් පිළිබඳ යුනානි විශේෂඥ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධිය සහ අධ්‍යයන මණ්ඩල සහතිකකරණ වැඩසටහනට පුහුණුවන්නන් දෙදෙනෙක් බඳවා ගන්නා ලදී.

විශේෂඥ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි වැඩසටහන් අනුමත කිරීම්

එයට අමතරව, දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සහ කොළඹ විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ නිර්දේශය ඇතිව පහත දැක්වෙන යුනානි පිළිබඳ විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධි වැඩසටහන් දෙක සඳහා වූ අයදුම්පත්‍ර අනුමැතිය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

1. යුනානි ඉල්මුල් අද්වියා පිළිබඳ විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධිය සහ අධ්‍යයන මණ්ඩල සහතිකය
2. යුනානි අමිරාස් ඊ නිස්වාන් පිළිබඳ විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධිය සහ අධ්‍යයන මණ්ඩල සහතිකය

2.6 සිද්ධ විශේෂඥ වෛද්‍ය උපාධිය සහ මණ්ඩල සහතිකකරණ වැඩසටහන්
විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා අනුමැතීන්

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සහ කොළඹ විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ නිර්දේශය ඇතිව පහත දැක්වෙන සිද්ධ පිළිබඳ විශේෂඥ වෛද්‍ය උපාධි වැඩසටහන් දෙක සඳහා වූ අයදුම්පත්‍ර 2020 වර්ෂයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද අතර දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය එම විශේෂඥ වෛද්‍ය උපාධි වැඩසටහන් ආරම්භ කිරීම පිණිස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය අපේක්ෂාවෙන් සිටී.

1. සිද්ධ ගුණපාඩම් පිළිබඳ විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධිය සහ අධ්‍යයන මණ්ඩල සහතිකය
2. සිද්ධ මරුතුවම් පිළිබඳ විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධිය සහ අධ්‍යයන මණ්ඩල සහතිකය

3. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පරිපාලන අංශ සහ පුස්තකාලය

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පරිපාලන කටයුතු ප්‍රධාන වශයෙන් ආයතනයේ පරිපාලන අංශය සහ මූල්‍ය අංශය මඟින් සිදු කරනු ලැබේ. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුස්තකාලය 2021 වර්ෂයේ දී ස්ථාපිත කරන ලදී.

3.1 පරිපාලන අංශය

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පරිපාලන අංශය මඟින් සියලුම සාමාන්‍ය පරිපාලන කටයුතු සහ අධ්‍යයන කටයුතුවලට පහසුකම් සැලසීම පිළිබඳ ක්‍රියාකාරකම් පවත්වා ගෙන යනු ලැබේ. කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම් සහ වෙනත් රැස්වීම් පැවැත්වීම සඳහා පරිපාලන සහයෝගය ලබාදීම, කොළඹ විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ සහ පාලක සභාවේ මෙන්ම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ලේඛන ඉදිරිපත් කිරීම, අධ්‍යයන වැඩසටහන් සහ ශිෂ්‍ය අවශ්‍යතාවන් සම්බන්ධ ලේඛන පිළිබඳව අදාළ බලධාරීන් සමඟ කටයුතු කිරීම සමාලෝචිත වර්ෂය තුළ දී පරිපාලන අංශය මඟින් අධ්‍යයන කටයුතු ආශ්‍රිතව ඉටු කරනු ලැබූ ප්‍රධාන ක්‍රියාකාරකම් විය.

මෙයට අමතරව, කාර්ය මණ්ඩලය බඳවා ගැනීම මඟින් දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට මානව සම්පත් එකතු කර ගැනීම හා පෞද්ගලික ලිපි ගොනු කළමනාකරණය, අළුත්වැඩියා කටයුතු, ගොඩනැගිලි හා උපකරණ නඩත්තුව, කාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයින් සඳහා පොදු සේවාවන් සැපයීම, සේවා ප්‍රසම්පාදනය හා සන්නිවේදන පහසුකම් සැපයීම සහ ප්‍රවාහන සේවාවන් සැපයීම පරිපාලන අංශය මඟින් ඉටු කරන පරිපාලන කටයුතු රාශිය අතර වේ. 2022 වර්ෂයේ දී පරිපාලන අංශයට එක් ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරයෙක් සහ කළමනාකරණ සහකාරවරුන් හතරදෙනෙක් ඇතුළත් විය.

3.2 මූල්‍ය අංශය

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය අංශය මූල්‍ය පරිපාලන ආශ්‍රිත කටයුතු ඉටු කරනු ලබන අතර අයිතම ප්‍රසම්පාදනය, වාර්ෂික, කාර්තුමය හා මාසික අයවැය සකස් කිරීම, මූල්‍ය කටයුතු පිළිබඳ වාර්තා අදාළ බලධාරීන්ට යැවීම, ආයතනය මඟින් ලබා ගන්නා සියලුම සේවා සඳහා ගෙවීම් සිදු කිරීම, සුළු මුදල් කළමනාකරණය, චෙක්පත් නිකුත් කිරීම, වැටුප් ගෙවීම ආදී කටයුතු දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය අංශය මඟින් කළමනාකරණය කරනු ලබන ප්‍රධාන කටයුතු අතර වේ.

මෙයට අමතරව, දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සඳහා සියලුම පුනරාවර්තන හා ප්‍රාග්ධන අයිතම, ද්‍රව්‍ය, පොත්, වාරසඟරා ආදිය ප්‍රසම්පාදනය දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය අංශය මඟින් සිදු කරනු ලබයි. 2022 වර්ෂයේ දී මූල්‍ය අංශයට ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරයෙක් සහ කළමනාකරණ සහකාරවරුන් දෙදෙනෙක් ඇතුළත් විය.

3.3 පුස්තකාලය

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුස්තකාලය 2022 නොවැම්බර් මස 01වැනි දින සිය දොරටු නිල වශයෙන් සිය පරිශීලකයින් සඳහා විවෘත කරන ලදී. 2022 ඔක්තෝබර් මස 31 වැනි දින මාර්ගගත පුස්තකාල ප්‍රේරණ සැසියක් පවත්වන ලදී. ආයුර්වේදය සහ යුනානි පිළිබඳ ග්‍රන්ථ එක්රැස් කර ගැනීම මඟින් පුස්තකාල පරිශීලකයින් සඳහා වඩාත් පුළුල් පුස්තකාල සහ තොරතුරු සේවා සැපයීම වෙනුවෙන් ග්‍රන්ථ එකතුව තවදුරටත් ව්‍යාප්ත කරමින් පවතී. 2022 වර්ෂයේ දී පුස්තකාලය සඳහා ග්‍රන්ථ 225ක් මිල දී ගන්නා ලදී. වර්තමානයේ දී මුද්‍රිත පොත් සහ ඉලෙක්ට්‍රොනික සම්පත් වශයෙන් පුස්තකාල සම්පත් ආකාර දෙකකට ලබා ගැනීමේ පහසුකම පවතී. අධ්‍යයන මණ්ඩලය සහ පුස්තකාල කමිටුව මඟින් සියලුම මුද්‍රිත ආයුර්වේදය සහ යුනානි ග්‍රන්ථ එකතුව අනුමත කරන ලදී. කොළඹ විශ්වවිද්‍යාලයේ පුස්තකාලය දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විද්‍යුත් පුස්තකාල දත්තපදනම් හතරකට සම්බන්ධ කර ඇත. එමෙන්ම දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුස්තකාලය SLISTINET හි සාමාජිකත්වය දරයි. තව ද, දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ පුස්තකාලය 2022 වර්ෂයේ දී අපගේ පශ්චාත් උපාධි අභ්‍යාසලාභීන්ට ඔවුන්ගේ පර්යේෂණ කාර්යයන් සඳහා පුස්තකාල පහසුකම් ලබා ගැනීමට ඉඩකඩ සලසා ඇත.

මේ වන විට දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුස්තකාලය තුළ ඉතා හොඳින් සංවිධානගත කළ ග්‍රන්ථ එකතුවක් මෙන්ම කියැවීම් ශාලාවක් ද ඇත. කියවීම් ඉඩකඩ අධ්‍යයන කටයුතු සඳහා පරිශීලනය කිරීමට අපේක්ෂා කරනු ලබන අතර වරකට ශිෂ්‍යයින් 10 – 15 අතර සංඛ්‍යාවකට පහසුකම් සලසයි. ශිෂ්‍යයින්ට සිය අධ්‍යයන කටයුතු සහ පර්යේෂණ කටයුතු සඳහා පුස්තකාලය තුළ දී පෞද්ගලික මෙවලම් භාවිතා කළ හැකිය. එමෙන්ම අධ්‍යයන කාර්යයන් වෙනුවෙන් පශ්චාත් උපාධි අභ්‍යාසලාභීන් සඳහා වයිෆයි අන්තර්ජාල පහසුකම් ද සපයා ඇත. පුස්තකාලයේ කියවීම් පහසුකම්, ආලෝකකරණ පහසුකම් වැනි පහසුකම් ඉහළ නැංවීමට අවශ්‍ය පියවර ගනිමින් ඇත.

පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ මොඩියුලයේ දී සහකාර පුස්තකාලයාධිපති විසින් පශ්චාත් උපාධි අභ්‍යාසලාභීන් සඳහා සාහිත්‍ය සමාලෝචනය සහ යොමු කළමනාකරණය පිළිබඳ සැසි පවත්වන ලදී. එමෙන්ම දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා තොරතුරු සොයා ගැනීමේ ශිල්පක්‍රම සහ තොරතුරු සමුද්ධරණය පිළිබඳ දේශනයක් පවත්වන ලදී. සහකාර පුස්තකාලයාධිපති SLTC මණ්ඩල-සංවිධානය කළ පුස්තකාල සහ විඥාපන විද්‍යාව පිළිබඳ අතථ්‍ය අන්තර්ජාතික සම්මන්ත්‍රණයට (2022-VICLIS) සහභාගී වී, පර්යේෂණ ලිපියක් ඉදිරිපත් කරන ලදී. එමෙන්ම සහකාර පුස්තකාලයාධිපති ශ්‍රී ලංකා පුස්තකාල සංගමය මඟින් සංවිධානය කළ පුස්තකාල සහ විඥාපන විද්‍යාව පිළිබඳ ජාතික සම්මන්ත්‍රණයට (NACLIS 2022) සහභාගී විය.

4. මානව සම්පත් දත්ත

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මුළු සේවක සංඛ්‍යාව දාසයකි (16). 2022 වර්ෂයේ දී කළමනාකරණ සහකාරවරුන් තනතුරු තුනක (03) පුරප්පාඩු සම්පූර්ණ කරන ලදී. එක් කළමනාකරණ සහකාරවරයෙක් (පොත් තැබීම) මාර්තු මාසයේ දී බඳවා ගන්නා ලද අතර එක් කළමනාකරණ සහකාරවරයෙක් මැයි මාසයේ දී වෙනත් විශ්වවිද්‍යාලයකින් මාරු වීම් ලැබ පැමිණි අතර අනෙක් කළමනාකරණ සහකාරවරයා දෙසැම්බර් මාසයේ දී උසස් කිරීම් කාණ්ඩය යටතේ බඳවා ගන්නා ලදී.

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී සඳහා උසස්වීමක් හිමි වූ අතර වෙනත් ආයතනයක සේවයට අනුයුක්ත කරන ලදී. ඒ අනුව වෙනත් ආයතනයක සේවය කළ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරිවරයෙක් මාස දෙකක කාලයක් සඳහා වැඩ බැලීමේ පදනම මත දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සේවය කරන ලදී. පසුව නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරයෙක් පැවරුම් පදනම (ශිෂ්ටාචාරික නිවාඩු මත) දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට අනුයුක්ත කරන ලදී.

2021 වසරේදී දෙසැම්බර් මස බඳවා ගත් දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සේවය කළ අභ්‍යාසලාභී තාක්ෂණික නිලධාරියා 2022 ජූලි මාසයේ දී එම තනතුරෙන් ඉල්ලා අස් විය. 2022 වර්ෂය තුළ දී බහු-කාර්ය සංවර්ධන දෙපාර්තමේන්තුවේ වැඩ සහායකවරුන් දෙදෙනෙක් දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට අනුයුක්ත කරන ලදී.

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට අලුතින් බඳවා ගත් අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා විශ්වවිද්‍යාල පරිපාලන පද්ධතිය පිළිබඳව දැනුවත්භාවය ලබාදීම පිණිස ප්‍රේරණ පුහුණු වැඩසටහන් මාලාවක් පවත්වන ලදී. කොළඹ විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී සහ ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරීන් සහ දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වැඩබලන නියෝජ්‍ය මූල්‍යාධිකාරී මෙම පුහුණු වැඩසටහන්වල සම්පත්දායකයින් ලෙස කටයුතු කරන ලදී.

4.1 අනුමත සේවක සංඛ්‍යාව සහ වර්තමාන කාර්ය මණ්ඩලය

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව සහ 2022 දෙසැම්බර් 31 වැනි දින වන විට සිටින කාර්ය මණ්ඩල සාමාජිකයින් පහත දැක්වෙන 10 වැනි වගුවේ දක්වා ඇත.

තනතුර	සේවය	ශ්‍රේණිය	වැටුප් කේතය	සේවා මට්ටම	අනුමත සේවක සංඛ්‍යාව	සත්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු
වැඩ සහායක*	Department	III/II/I/විශේෂ	U-PL 1	ප්‍රාථමික	02	0	02
රියැදුරු	UDS	III/II/I/විශේෂ	U-PL 3	ප්‍රාථමික	03	0	03
කළමනාකරණ සහකාර (පොත් තැබීම)	UMAS	III/II/I	U-MN 1	ද්විතීය	01	01	0
කළමනාකරණ සහකාර	UMAS	III/II/I	U-MN 1	ද්විතීය	05	05	0
තාක්ෂණික නිලධාරී	UTS	III/II/I	U-MT 1	ද්විතීය	01	0	1
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී	UAසහFS	II/I	U-EX	ජ්‍යෙෂ්ඨ	01	0	1
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී	UAසහFS	II/I	U-EX	ජ්‍යෙෂ්ඨ	01	01	0
සහකාර පුස්තකාලයාධිපති	අධ්‍යයන		UAC 3	ජ්‍යෙෂ්ඨ	01	01	0
අධ්‍යක්ෂ	අධ්‍යයන		U-AC 5	ජ්‍යෙෂ්ඨ	01	01	0
එකතුව					**16**	**09**	**07**

*2022.08.30 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩ සහායක නිලධාරීන් දෙදෙනෙක් බහුකාර්ය සංවර්ධන දෙපාර්තමේන්තුවේ සිට අනුයුක්ත කර ඇත.

වගුව - 10

දෙවැනි කොටස

අවසාන ගිණුම් සහ විගණන තොරතුරු

2022

5. 2022 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනය

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

දෙසැම්බර් මස 31වැනි දිනට	සටහන් අංකය	2022 රු.	2021 රු. (පුනප්‍රකාශිත)	2021 රු. (විගණිත)
වත්කම්				
ජංගම වත්කම්				
මුදල් හා මුදල් සමාන දෑ	**3**	13,166,716	16,396,756	16,396,756
ස්ථිර තැන්පතුවල ආයෝජනය	**4**	3,463,493	3,439,604	3,439,604
ලැබිය යුතු දෑ	**5**	741,378	357,080	357,080
කාර්ය මණ්ඩලයට ණය සහ අත්තිකාරම්	**6**	147,278	132,900	132,900
අත්තිකාරම්	**7**	2,284	19,132	19,132
භාණ්ඩ ලේඛන / තොග	**8**	489,723	463,551	463,551
මුළු ජංගම වත්කම්		18,010,871	20,809,023	20,809,023
ජංගම නොවන වත්කම්				
කාර්ය මණ්ඩලයට ණය සහ අත්තිකාරම්	**6**	461,922	201,267	201,267
දේපළ, පිරියත හා උපකරණ (ශුද්ධ)	**9**	8,084,459	5,318,004	5,318,004
අස්පෘෂ්‍ය වත්කම්	**10**	60,192	-	-
මුළු ජංගම නොවන වත්කම්		8,606,573	5,519,271	5,519,271
මුළු වත්කම්		**26,617,444**	**26,328,294**	**26,328,294**
වගකීම්				
ජංගම වගකීම්				
උපචිත වියදම්	**11**	3,936,727	3,804,182	3,804,182
ගෙවිය යුතු දෑ	**12**	1,131,018	1,022,350	1,022,350
විලම්භිත ආදායම		1,358,333	525,000	525,000
මුළු ජංගම වගකීම්		6,426,078	5,351,532	5,351,532
ජංගම නොවන වගකීම්				
පාරිතෝෂික සඳහා වෙන්කිරීම්	**13**	1,565,030	1,505,304	1,505,304
මුළු ජංගම නොවන වගකීම්		1,565,030	1,505,304	1,505,304
මුළු වගකීම්		**7,991,108**	**6,856,836**	**6,856,836**
මුළු ශුද්ධ වත්කම්		**18,626,336**	**19,471,457**	**19,471,457**

ශුද්ධ වත්කම්/හිමිකම්

වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන	**14**	-	-	3,490,305
වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන	**15**	849,575	4,887,453	4,887,453
MOHE වලින් ප්‍රාග්ධන ප්‍රදාන	**16**	7,000,000	7,000,000	8,047,199
සමුච්චිත අතිරික්තය /(හිඟය)	**17**	10,776,761	7,584,003	3,046,499
මුළු ශුද්ධ වත්කම්/හිමිකම්		**18,626,336**	**19,471,457**	**19,471,457**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය නිකුත් කර ඇති රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව සකස් කර, ඉදිරිපත් කර ඇත.

.....
කේ. එච්. ඒ. ඩී. ද සිල්වා
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී
(වැඩබලන)

.....
ඩබ්ලිව්.එන්.පී.එම්.එන්.එන්. කරුණාරත්න
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී

කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින් මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා වගකීම දරයි.

මෙම මූල්‍ය ප්‍රකාශන කළමනාකරණ මණ්ඩලය මගින් අනුමත කර ඔවුන් වෙනුවෙන් අත්සන් කර ඇත.

.....
මහාචාර්ය ක්‍රිෂාන්ත අබේසේන
අධ්‍යක්ෂ

.....
ටී. ධර්මරාජා
කළමනාකරණ මණ්ඩල සාමාජික

.....
එස්. ඩී. ඩබ්. සමන් දියගහ වඩුගේ
කළමනාකරණ මණ්ඩල සාමාජික

වරහන් තුළ ඇති සංඛ්‍යාවලින් අඩු කිරීම් දැක්වේ.

පිටු අංක 29 සිට 49 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගත කොටසකි.

* ඉංග්‍රීසි පිටපතෙහි අත්සන් සඳහන් කර ඇත.

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය
මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය

දෙසැම්බර් මස 31 වැනි දිනට	සටහන් අංකය	2022 රු.	2021 රු. (පුනප්‍රකාශිත)	2021 රු. (විගණිත)
ආදායම				
හුවමාරු නොකළ ගනුදෙනුවලින් ආදායම - ජංගම				
ප්‍රනාරාවර්තන වියදම් සඳහා ආණ්ඩුවේ ප්‍රදානය		21,275,000	19,777,000	19,777,000
හුවමාරු නොවන ගනුදෙනුවලින් මුළු ආදායම -ජංගම		21,275,000	19,777,000	19,777,000
හුවමාරු ගනුදෙනුවලින් ආදායම - ජංගම				
උත්පාදික ආදායම	**18**	2,940,501	2,991,000	2,991,000
වෙනත් ආදායම	**19**	1,288,846	268,647	268,647
හුවමාරු ගනුදෙනුවලින් මුළු ආදායම - ජංගම		4,229,347	3,259,647	3,259,647
මුළු ආදායම - ජංගම		**25,504,347**	**23,036,647**	**23,036,647**
මෙහෙයුම් වියදම් -ජංගම				
සේවක පඩිනඩි	**21-A**	18,620,210	15,756,574	15,756,574
ගමන් සහ යැපීම් දීමනාව	**21-B**	26,820	90,302	90,302
සැපයුම් හා පාරිභෝගික භාණ්ඩ	**21-C**	1,153,917	525,074	525,074
නඩත්තු වියදම්	**21-D**	118,477	74,446	74,446
කොන්ත්‍රාත් සේවා	**21-E**	2,920,015	2,342,167	2,342,167
වෙනත් පුනරාවර්තන වියදම්	**21-F**	2,854,716	2,126,755	2,126,755
මුළු මෙහෙයුම් වියදම් - ජංගම		**25,694,155**	**20,915,318**	**20,915,318**
පරිච්ඡේදය සඳහා ජංගම අතිරික්තය /(හිඟය)		**(189,809)**	**2,121,329**	**2,121,329**
හුවමාරු නොවන ගනුදෙනුවලින් ආදායම - ප්‍රාග්ධනය				
ප්‍රාග්ධන වියදම් සඳහා ආණ්ඩුවේ ප්‍රදාන		4,037,879	534,795	-
ක්‍රමක්ෂ ආදායම	**20**	-	-	870,055
හුවමාරු නොවන ගනුදෙනුවලින් මුළු ආදායම -ප්‍රාග්ධනය		4,037,879	534,795	870,055
හුවමාරු ගනුදෙනුවලින් ආදායම- ප්‍රාග්ධනය		-	-	-
හුවමාරු ගනුදෙනුවලින් මුළු ආදායම -ප්‍රාග්ධනය		-	-	-
මුළු ආදායම –ප්‍රාග්ධනය		**4,037,879**	**534,795**	**870,055**
මෙහෙයුම් වියදම් -ප්‍රාග්ධනය				
ක්ෂයවීම්	**21-G**	1,206,424	870,055	870,055
ක්‍රමක්ෂය	**21-H**	4,808	-	-
මුළු මෙහෙයුම් වියදම් - ප්‍රාග්ධන		**1,211,232**	**870,055**	**870,055**

පරිච්ඡේදය සඳහා ප්‍රාග්ධන අතිරික්තය/(හිඟය)	**2,826,647**	**(335,261)**	**-**
පරිච්ඡේදය සඳහා මුළු අතිරික්තය/(හිඟය)	**2,636,838**	**1,786,068**	**2,121,329**
පරිච්ඡේදය සඳහා ජංගම අතිරික්තය/(හිඟය)	**(189,809)**	**2,121,329**	**2,121,329**
පරිච්ඡේදය සඳහා ප්‍රාග්ධන අතිරික්තය/(හිඟය)	**2,826,647**	**(335,261)**	**-**

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය
හිමිකම්/ ශුද්ධ වත්කම්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය
2022 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා

(විගණිත) **(රු.)**

	සමුච්චිත අරමුදල	වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන	වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන	MOHE වලින් ප්‍රාග්ධන ප්‍රදාන	**එකතුව**
2021 ජනවාරි මස 01වැනි දිනට ශේෂය	925,170	3,469,477	2,422,248	8,403,288	15,220,184
ප්‍රදාන ක්‍රමක්ෂය	-	(513,966)	-	(356,089)	(870,055)
ලැබූ ප්‍රාග්ධන ප්‍රදාන	-	-	3,000,000	-	3,000,000
වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන	-	534,795	(534,795)	-	-
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය	2,121,329	-	-	-	2,121,329
2021 දෙසැම්බර් මස 31වැනි දිනට ශේෂය	**3,046,499**	**3,490,305**	**4,887,453**	**8,047,199**	**19,471,457**

(පුනප්‍රකාශිත) **(රු.)**

	සමුච්චිත අරමුදල	වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන	වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන	MOHE වලින් ප්‍රාග්ධන ප්‍රදාන	**එකතුව**
2021 ජනවාරි මස 01වැනි දිනට ශේෂය	5,797,935	-	2,422,248	7,000,000	15,220,184
ප්‍රදාන ක්‍රමක්ෂය	-	-	-	-	-
ලැබූ ප්‍රාග්ධන ප්‍රදාන	-	-	3,000,000	-	3,000,000
වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන	-	534,795	(534,795)	-	-
ආදායම් ප්‍රකාශයට මාරු කිරීම	-	(534,795)		-	(534,795)
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය	1,786,068	-	-	-	1,786,068
2021 දෙසැම්බර් මස 31වැනි දිනට ශේෂය	**7,584,003**	**-**	**4,887,453**	**7,000,000**	**19,471,457**
ප්‍රදාන ක්‍රමක්ෂය	-	-	-	-	-
ලැබූ ප්‍රාග්ධන ප්‍රදාන	-	-	-	-	-
ගැලපීම්	555,919	-	-	-	555,919
වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන	-	4,037,879	(4,037,879)	-	-
ආදායම් ප්‍රකාශයට මාරු කිරීම		(4,037,879)			(4,037,879)
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය	2,636,838				2,636,838
2022 දෙසැම්බර් මස 31වැනි දිනට ශේෂය	**10,776,761**	**-**	**849,575**	**7,000,000**	**18,626,336**

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා		**2022**		**2021**
		රු.		රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මූල්‍ය ප්‍රවාහය				
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් අතිරික්තය		2,636,838		1,786,068
ගැලපීම්				
මූල්‍ය නොවන සංචලන				
දේපළ, පිරියත හා උපකරණ ක්ෂයවීම		1,206,424		870,055
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය		4,808		-
පාරිතෝෂිකය සඳහා වෙන්කිරීම		59,726		135,701
ආයෝජනවලින් පොලී ආදායම		(1,268,949)		(246,122)
ප්‍රදාන ක්‍රමක්ෂය		-		-
පෙර වර්ෂයේ සමුච්චිත වියදම් ප්‍රතිවර්තනය		555,919		-
වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන ආදායම් ගිණුමට මාරු කිරීම		(4,037,879)		(534,795)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් අතිරික්තය		**(843,112)**		**2,010,907**
භාණ්ඩ තොගවල වැඩිවීම/ අඩුවීම		(26,172)		(367,916)
ජංගම වත්කම්වල වැඩිවීම/අඩුවීම		(227,559)		(371,482)
ජංගම වගකීම්වල වැඩිවීම / අඩුවීම		257,795		96,485
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහ		**(839,048)**		**1,367,994**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් /මූල්‍ය ප්‍රවාහය				
දේපළ, පිරියත හා උපකරණ අත්කර ගැනීම		(3,156,128)		(454,795)
අස්පෘෂ්‍ය වත්කම් අත්කර ගැනීම		(65,000)		-
කාර්ය මණ්ඩලයට ණය ගෙවීම්		(543,034)		-
කාර්ය මණ්ඩලයෙන් ණය ආපසු අය කර ගැනීම්		268,001		152,900
ස්ථාවර තැන්පතු අස්කර ගැනීම		3,439,604		-
ස්ථිර තැන්පතුවල ආයෝජනය		(3,370,000)		(1,870,000)
අරමුදල් කළමනාකරණ ගිණුමෙන් පොලී ආදායම		1,035,565		176,071
ආයෝජන ක්‍රියාකාරකම් වලින් භාවිතා කළ ශුද්ධ මූල්‍ය ප්‍රවාහ		**(2,390,992)**		**(1,995,824)**
මූල්‍යකරණ ක්‍රියාකාරකම්වලින් මූල්‍ය ප්‍රවාහ				
වසර සඳහා ලැබූ ප්‍රාග්ධන ප්‍රදාන		-		3,000,000
මූල්‍යකරණ ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහ		**-**		**3,000,000**
මුදල් හා මුදල් සමාන දෑවල ශුද්ධ වැඩිවීම / (අඩුවීම)		(3,230,040)		2,372,170
වසර ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ		16,396,756		14,024,586
වසර අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ		**13,166,716**		**16,396,756**
මුදල් හා මුදල් සමාන දෑ				
මුදල් සහ බැංකු ශේෂ (**සටහන 3**)		**13,166,716**		**16,396,756**

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය
මූල්‍ය සාධනයේ අයවැය සමඟ සංසන්දනාත්මක ප්‍රකාශනය

දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා		සටහන		**2022** තථ්‍ය රු.		**2022** අයවැය රු.
ආදායම						
භාණ්ඩාගාරයෙන් ලැබුණු පුනරාවර්තන ප්‍රදාන				21,275,000		23,186,000
උත්පාදිත ආදායම		**18**		2,940,501		3,000,000
වෙනත් ආදායම		**19**		1,288,846		-
වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන මාරු කිරීම		**20**		4,037,879		-
මුළු ආදායම				**29,542,225**		**26,186,000**
මෙහෙයුම් වියදම්						
සේවක පඩිනඩි		**21-A**		18,620,210		19,386,000
ගමන් සහ යැපීම් දීමනාව		**21-B**		26,820		50,000
සැපයුම් හා පාරිභෝගික භාණ්ඩ		**21-C**		1,153,917		685,000
නඩත්තු වියදම්		**21-D**		118,477		50,000
කොන්ත්‍රාත් සේවා		**21-E**		2,920,015		3,130,000
වෙනත් පුනරාවර්තන වියදම්		**21-F**		2,854,716		2,885,000
ක්ෂයවීම		**21-G**		1,206,424		-
ක්‍රමක්ෂය		**21-H**		4,808		-
මුළු මෙහෙයුම් වියදම්				**26,905,387**		**26,186,000**
කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/(හිඟය)				**2,636,838**		-

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2022 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා

1. සාමාන්‍ය තොරතුරු

1.1 නෛතික හා ආයතනික ස්ථාපනය

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIIM) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24 ඒ වගන්තිය සමඟ කියවිය යුතු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් 2017 අංක 05 දරන ආඥා පනතත් 18වැනි වගන්තිය මඟින් පිහිටුවන ලද අතර 2017 අංක 2031/38 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදී. විද්‍යායතනය කොළඹ විශ්වවිදයාලයට අනුබද්ධ ආයතනයක් වන අතර ආඥා පනතේ විස්තර කළ 2019 පෙබරවාරි මස එහි කටයුතු ආරම්භ කරන ලදී. විද්‍යායතනය කාර්යාලය බොරැල්ල, කොටා පාර, ආයුර්වේද ශික්ෂණ රෝහලේ 5වැනි මහළේ තාවකාලිකව ස්ථාපනය කර ඇත.

2022 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය, සමකොටස් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය 2023 පෙබරවාරි මස 17 වැනි දින පවත්වන ලද කළමනාකරණ මණ්ඩලය මඟින් අනුමත කර ඇත.

1.2 මූල්‍ය කාලපරිච්ඡේදය

ආයතනයේ මූල්‍ය කාලපරිච්ඡේදය 2022 ජනවාරි 01 වැනි දින සිට 2022 දෙසැම්බර් 31 වැනි දින දක්වා වේ.

1.3 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුමේ ස්වභාවය

(අ) ආයතනයේ සහ විශ්වවිද්‍යාලයේ නිර්දේශය මත කොමිෂන් සභාව මඟින් අනුමත කරන පරිදි ආයුර්වේදය, යුනානි සහ සිද්ධ වෛද්‍ය ක්‍රම පිළිබඳ විශේෂඥ ක්ෂේත්‍ර පිළිබඳ පශ්චාත් උපාධි උපදේශනය, පුහුණුව සහ පර්යේෂණ සඳහා ශිෂ්‍යයින් බඳවා ගැනීම සහ එම සේවා සැපයීම.

(ආ) විශ්වවිද්‍යාලයේ අනුමැතිය සහ කොමිෂන් සභාවේ එකඟතාව ඇතිව ආයුර්වේදය, යුනානි සහ සිද්ධ වෛද්‍ය ක්‍රම හෝ අදාළ විශේෂඥ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පශ්චාත් උපාධි, පශ්චාත් උපාධි ඩිප්ලෝමා, පශ්චාත් උපාධි සහතිකපත්‍ර සහ වෙනත් අධ්‍යයන විශිෂ්ඨතා පිරිනැමීමට තීරණය කිරීම.

(ඇ) විශ්වවිද්‍යාලයේ අනුමැතිය ඇතිව ආයුර්වේදය, යුනානි සහ සිද්ධ වෛද්‍ය ක්‍රම හෝ අදාළ විශේෂඥ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂඥතා අත්කර ගත් තැනැත්තන් තීරණය කිරීමේ කාර්‍ය සඳහා පශ්චාත් උපාධි පරීක්ෂණ පැවැත්වීම සහ පර්යේෂණ සමත්ව සිටින සහ ආයතනයේ අදහස් විමසා විශ්වවිද්‍යාලය මඟින් නියම කරන අනු-නීති අනුව වෙනත් කොන්දේසි සම්පූර්ණ කර ඇති, ඒ අනුව විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි, පශ්චාත් උපාධි ඩිප්ලෝමා, පශ්චාත් උපාධි සහතිකපත්‍ර සහ වෙනත් අධ්‍යයන විශිෂ්ඨතා ප්‍රදානය කිරීමට සුදුසුකම් සම්පූරාලන තැනැත්තන් පිළිබඳව විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම.

(ඈ) ආයතනයේ පරමාර්ථ වලට සමාන පරමාර්ථ ඇති වෙනත් විශ්වවිද්‍යාල හෝ ආයතන සමඟ ගුරු, ශිෂ්‍ය සහ විද්වතුන් හුවමාරු කර ගැනීම හෝ වෙනත් ආකාරයකින් සහයෝගීතා ඇති කර ගැනීම.

1.4 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පිළිබඳ මූලධර්මය මත පදනම්ව සකසා ඇත.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම

1.5.1 අනුකූලතාව පිළිබඳ ප්‍රකාශනය

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ රාජ්‍ය ගිණුම් ප්‍රතිපත්තිවලට (SLPSAS) අනුකූලව ඓතිහාසික පිරිවැය පදනම යටතේ පිළියෙළ කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වලින් සමන්විත වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී අදාළ කර ගත් මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත.

1.5.2 මිනුම් කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත සහ ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇති අතර යෝග්‍ය අවස්ථා වලදී අදාළ සටහන් යටතේ ඇති සාධාරණ වටිනාකම් සම්බන්ධයෙන් යෝග්‍ය හෙලිදරව් කිරීම් සිදු කර ඇත.

1.5.3 තුලනාත්මක තොරතුරු

වර්තමාන කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධය වැඩි දියුණු කිරීම සහ තුලනාත්මක බව වැඩි දියුණු කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශනවල වාර්තා වී ඇති සියලු මුදල් සඳහා පෙර කාල පරිච්ඡේදයට සාපේක්ෂව තුලනාත්මක තොරතුරු අනාවරණය කරනු ලැබේ. 2021 වර්ෂය සඳහා ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවල පුද්ගල පඩිනඩි වියදම් පිළිබඳ වර්ගීකරණ දෝෂ කිහිපයක් පැවතුනි. 2022 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන වලින් එකී වර්ගීකරණ දෝෂ නිවැරදි කරන ලද අතර තුලනාත්මක සංඛ්‍යා ගලපන ලදි.

හුවමාරු නොකළ ගනුදෙනු හඳුනා ගැනීම සහ මැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් අදාළ කර ගැනීම හේතුවෙන් ප්‍රාග්ධන ප්‍රදාන වියදම් කළ ගිණුම, MOHE වලින් ප්‍රාග්ධන ප්‍රදාන සහ සමුච්චිත අතිරික්තය/ හිඟය ගිණුම ගලපන ලද අතර පහත දැක්වෙන පරිදි ප්‍රකාශ කරන ලදී.

විස්තරය	වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම (රු.)	MOHEවලින් ප්‍රාග්ධන ප්‍රදාන (රු.)	සමුච්චිත අතිරික්තය/ හිඟය (රු.)
2021.12.31 දිනට ශේෂය (පසුගිය වර්ෂයේ විගණිත ගිණුම්වලට අනුව)	3,490,305	8,047,199	3,046,499
2021 වර්ෂයේ ක්‍රමක්ෂය වෙනස් කිරීම	513,966	356,089	(870,055)
2021 වර්ෂයේ දී වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන මාරු කිරීම	(534,795)	-	534,795
2021.12.31 දිනට ශේෂය (පුනප්‍රකාශිත)	3,469,476	8,403,288	2,711,239
සමුච්චිත අරමුදලට මාරු කිරීම (SLPSAS-11 අනුව)	(3,469,476)	(1,403,288)	4,872,764
2021.12.31 දිනට පුනප්‍රකාශිත ශේෂය	-	7,000,000	7,584,003

1.5.4 වැදගත්භාවය සහ සමුහනය

සමාන අයිතම සහිත ද්‍රව්‍ය මූල්‍ය ප්‍රකාශනවල වෙන්ව වර්ගීකරණය කර ඇති අතර නොසැලකිය යුතු තරම් කුඩා අසමානතා ඇති අවස්ථාවල හැර ස්වභාවයෙන් හෝ කාර්ය වශයෙන් අසමාන අයිතම වෙන් වෙන්ව දක්වා ඇත.

1.5.5 හිලව් කිරීම

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රතිපත්තිවලින් ඉල්ලා සිටින විට හෝ අවසර දෙන අවස්ථාවල දී හැර වෙනත් කිසිම විටක වත්කම්, බැරකම්, අය සහ වැය හිලව් කර නැත.

1.5.6 වාර්තාකරණ දිනයට පසු සිදුවීම්

වාර්තාකරන දිනයෙන් පසු සිදු වූ සියලුම සැලකිය යුතු අවස්ථා සැලකිල්ලට භාජනය කර ඇති අතර මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය තැන්හි දී සුදුසු ගැලපීම් හා හෙළිදරව් කිරීම් සිදු කර ඇත.

1.5.7 කෘත්‍යාත්මක සහ ව්‍යවහාරික මුදල් ඒකකය

ආයතනයේ කෘත්‍යාත්මක සහ ව්‍යවහාරික මුදල් ඒකකය වන "ශ්‍රී ලංකා රුපියල්" (රු.) වලින් මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර, ඉදිරිපත් කර ඇත.

1.5.8 වටැයීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලින් වෙනත් අයුරකින් අවසර දී ඇත්නම් මිස මූල්‍ය ප්‍රකාශනවල සඳහන් මුදල් ප්‍රමාණ ආසන්න රුපියලට වටයා ඇත.

1.5.9 සුවිශේෂ ගිණුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්

ගිණුම්කරණ ඇස්තමේන්තු සහ තීරණාත්මක විනිශ්චයන්වල සිදු වූ යම් වෙනස්කම් මූල්‍ය ප්‍රකාශනවල අදාළ සටහන්වල හෙළිදරව් කර ඇත.

2. සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

2.1 ජංගම වත්කම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත්තේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනයෙන් වර්ෂයක කාලයක් තුළ නැවත අය කර ගනු ලබන දේ වේ.

2.1.1 මුදල් සහ මුදල් සමාන දෑ

මූල්‍ය හා මුදල් සමාන දෑ අත ඇති මුදල්, බැංකු ශේෂය සහ කෙටි කාලීන ආයෝජනවලින් සමන්විත වේ.2019 වර්ෂයේ දී උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ප්‍රාග්ධන ප්‍රදානයක් ලෙස ලැබුනු රු.7,000,000.00 ක මුදල 2019 වර්ෂයේ දී අරමුදල් කළමනාකරණ ගිණුමට මාරු කරන ලද අතර ප්‍රවර්තන වර්ෂය තුළ උපයන ලද පොලිය රු.923,457.00 ක් වේ.

2.1.2 ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීම

2021 වර්ෂයේ දී රු. 500,000.00 බැගින් වූ ස්ථාවර තැන්පතු තුනක් අඛණ්ඩව නැවත අලුත් කිරීමේ පදනම මත බොරැල්ල සුපර් ග්‍රේඩ් ශාඛාවේ නැවත ආයෝජනය කරන ලදී. මෙම ස්ථාවර තැන්පතු තුන 2022 මෙම ප්‍රවර්තන වර්ෂය තුළ දී එම බැංකුවෙන් ඉවත් කර, මහජන බැංකුවේ පොලී අනුපාතය ඉහළ බැවින් එම බැංකුවේ නැවත ආයෝජනය කරන ලදී. තව ද, රු.1,870,000/- ක් 2022 ප්‍රවර්තන වර්ෂය තුළ දී ඉහළ පොලී අනුපාතයක් ඇතිව වර්ෂයක කාලයක් සඳහා ලංකා බැංකුවේ නැවත ආයෝජනය කරන ලදී. කළමනාකරණ මණ්ඩලය මෙම තීරණ අනුමත කරන ලද අතර ඉහත ආයෝජනවලින් 2022 වර්ෂය තුළ දී උපයන ලද පොලී ආදායම රු. 345, 492.00 කි.

2.1.3 භාණ්ඩ ලේඛන සහ තොග

බඩු තොග, පිරිවැය හා ශුද්ධ උපලබ්ධි වටිනාකම අතර වඩා අඩු අගය මත පෙන්වා දී ඇත. පොදුවේ පිරිවැය පෙර පිවිසි පෙර නිකුත් පදනම මත ගණනය කරනු ලබන අතර එහි දී අදාළ තොග අත්පත් කර ගැනීමටත් ඒවා පවත්නා තත්ත්වයට පත්කරලීමට හා පවත්නා ස්ථානයට ගෙන ඒමටත් වැය වූ වියදමද ඊට ඇතුළත් වේ. ආයතනයේ භාණ්ඩ ලේඛන වලට ලිපිද්‍රව්‍ය සහ අනෙකුත් පරිභෝජන ද්‍රව්‍ය ඇතුළත් වේ.

2.2 ජංගම නොවන වත්කම්

2.2.1 දේපළ පිරියත හා උපකරණ

කාර්යාල හා ඉගැන්වීමේ උපකරණ, ගෘහභාණ්ඩ හා සවිකිරීම්, පරිගණක හා පරිගණක උපාංග, පුස්තකාල පොත් සහ වෙනත් වත්කම් රජයේ ප්‍රදානවලින් අත්පත් කර ගත් අයිතමවලට ඇතුළත් වේ.

තව ද, ආයුර්වේද දෙපාර්තමේන්තුවට අයත් වන ගොඩනැගිල්ලෙන් දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කාර්යාල පරිශ්‍රය වෙන් කිරීම සඳහා සහ සිරස් තිරපටි සවි කිරීම සඳහා දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය රු. 172,901.40 ක් වැය කර ඇත. මෙම ගොඩනැගිල්ල දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට අයත් නොවන බැවින් මෙම මුදල සවි කිරීම් සහ උපාංග ශීර්ෂය යටතේ ප්‍රාග්ධන වියදමක් ලෙස හඳුනා ගෙන ඇත. සාමාන්‍යයෙන් ගොඩනැගිලි 5% ක අනුපාතිකයෙන් වසර 20 ක කාලපරිච්ඡේදයකට ක්ෂය කරනු ලැබේ. කෙසේවුව ද, මෙම ගොඩනැගිල්ල දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට අයත් නොවන බැවින්, මෙම සවිකිරීමේ සහ උපාංග වියදම 10% ක අනුපාතයක් යටතේ වසර 10 ක කාලපරිච්ඡේදයකට ක්ෂය කරනු ලැබේ.

කොළඹ විශ්වවිද්‍යාලය 2018 වර්ෂයේ දී උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබුනු මූලික ප්‍රදාන උපයෝජනය කරමින් දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සඳහා රු. 2,264,892.50ක් වටිනා වත්කම් ප්‍රසම්පාදනය කර ඇත. මෙම වත්කම් 2018 වර්ෂයේ දී කොළඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාවල ඔවුන්ගේ වත්කම් ලෙස හඳුනා ගෙන ප්‍රාග්ධනීය කර ඇත. තව ද, කොළඹ විශ්වවිද්‍යාලය මඟින් 2018 වර්ෂය සඳහා සමුච්චිත ක්ෂය ලෙස රු.149,425.53ක් වූ අගයක් හඳුනා ගෙන ඇත. ඒ අනුව දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ඔවුන්ගේ ශුද්ධ ලිඛිත වටිනාකම පදනම්ව අතිරේක වශයෙන් රු. 2,115,466.97 ක් වටිනා වත්කම් 2019.01.01 දිනට හඳුනා ගෙන, ප්‍රාග්ධනීය කර ඇති අතර අදාළ ප්‍රදානය වත්කම්වල ඉතිරි ප්‍රයෝජනවත් කාලය තුළ ක්‍රමක්ෂය කර ඇත.

අ) හඳුනා ගැනීමේ සහ මැනීමේ පදනම

දේපළ, පිරියත හා උපකරණ වල අනාගත අනාගත ආර්ථික ප්‍රතිලාභ විශ්වවිද්‍යාලයට ගලා එන්නේ නම් සහ එහි පිරිවැය විශ්වාසනීයව මැනිය හැක්කේ නම් හඳුනාගනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ පිරිවැය අඩු කිරීම සමුච්චිත ක්ෂය වීම් ලෙස වාර්තා කර ඇත. දේපළ, පිරියත හා උපකරණවල පිරිවැය ඒවා මිලදී ගැනීමේ පිරිවැය සහ ඒවා සම්බන්ධ අනුශංගික වියදම්වල එකතුව වේ.

සියලුම දේපළ, පිරියත හා උපකරණ ආරම්භයේදී පිරිවැයට දක්වන අතර පසුව පිරිවැය අඩු කිරීම සමුච්චිත ක්ෂයවීම සහ කිසියම් හානි කරන අලාභ ආදියට මනිනු ලැබේ. අළුත්වැඩියා කිරීමේ සහ නඩත්තු පිරිවැය ඒවා දරණ ලද ආකාරයට විස්තීණ ආදායම ප්‍රකාශනයේ දක්වා ඇත.

ආ) මූලික හඳුනා ගැනීම

වත්කම් එහි ස්වාභාවය මත ප්‍රග්ධනිත කර ඇත. සැලකිය යුතු පිරිවැයක් සහිත, වසරකට වඩා වැඩි කාලයක් පවතින ස්පෘශ්‍ය වත්කම් ප්‍රාග්ධනිත කරනු ලැබේ. වත්කමේ ජීවිත කාලය වසර 5 සිට වසර 20 දක්වා එහි කාණ්ඩය අනුව රඳා පවතී.

ඇ) පවත්නා ස්ථාවර වත්කම් වල පසුකාලීන පිරිවැය

පහත දැක්වෙන නිර්ණායක සම්පූර්ණ කරන්නේ නම් මිස, ස්පෘශ්‍ය ස්ථාවර වත්කම් මත දැරූ වියදම් එකී වියදම සිදු කළ කාලපරිච්ඡේදය තුළ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයෙහි ඇතුළත් කර දක්වා ඇති අතර එහි දී එය ප්‍රාග්ධනිත කර අදාළ පදනම මත ක්ෂය කරනු ලැබේ.

- ස්ථාවර වත්කම්වල වෙළඳපොළ වටිනාකම පසු කාලීනව ඉහළ ගොස් ඇත.
- වත්කම් ධාරිතාව ඉහළ ගොස් ඇත.
- නිමැවුමේ ගුණාත්මකභාවයේ තිරසාර වර්ධනයක් හෝ මෙහෙයුම් පිරිවැයේ අඩුවීමක්.
- අළුත්වැඩියා කිරීම සහ නඩත්තුව මඟින් තහවුරු කර ඇති කාලසීමාව ඉක්මවා වත්කමේ ජීවිත කාලය සැලකිය යුතු ලෙස දීර්ඝ කිරීම.

ඇ) ක්ෂයවීම

මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ, දේපළ පිරියත හා උපකරණ සඳහා, ඒවා භාවිතය සඳහා ගන්නා ලද දිනයේ සිට ඒවායේ ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය පුරාවට සරල මාර්ග ක්‍රමය යටතේ ගණනය කර ක්ෂය හඳුනා ගෙන ඇත. ඉඩම් ක්ෂය කරනු නොලැබේ. ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලයන් පහත දැක්වෙන පරිදි වේ.

විස්තරය	**ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය**
කාර්යාල හා ඉගෙනුම් උපකරණ	වර්ෂ 10
පරිගණක හා පරිගණක උපාංග	වර්ෂ 5
ගෘහභාණ්ඩ හා සවිකිරීම්	වර්ෂ 10
පුස්තකාල පොත්	වර්ෂ 5
සවිකිරීම් සහ උපාංග	වර්ෂ 10

භාවිතා කළ කාලය මත පදනම්ව, මිල දී ගත් දිනයේ සිට සහ අපහරණ දිනය දක්වා ක්ෂයවීම් කරනු ඇත. කොළඹ විශ්වවිද්‍යාලයෙන් මාරු කළ වත්කම් කොළඹ විශ්වවිද්‍යාලය මඟින් 2018 දෙසැම්බර් 31 දක්වා ක්ෂය කර ඇති බැවින් 2019.01.01 සිට ක්‍රියාත්මක වන පරිදි ක්ෂය කරනු ලැබේ.

2.2.2. අස්පෘශ්‍ය වත්කම්

සියලුම අස්පෘශ්‍ය වත්කම්, සමුච්චිත ක්ෂයවලින් පිරිවැය සහ යම් හානිවීමක් අඩු කිරීමෙන් පසුව මූලිකව හඳුනා ගෙන ඇත.

අස්පෘශ්‍ය වත්කම් පිරිවැයට, ඒවා මිල දී ගැනීමේ මිල ගණන් සහ එම වත්කම් අපේක්ෂිත ප්‍රයෝජනවත් භාවිතාවට ගෙන ඒම සඳහා දරන ලද පිරිවැය ඇතුළත් වේ.

අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය වසර 05ක කාලයක් සඳහා මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් කර ඇත. තව ද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 20 අනුව අස්පෘශ්‍ය වත්කම්වල ක්‍රමක්ෂ කාලය එක් එක් වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේ දී සමාලෝචනය කරනු ලබන අතර කිසියම් වෙනස්කමක් වෙතොත් ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් ලෙස ගණනය කරනු ලැබේ.

2.3 වගකීම් සහ ප්‍රතිපාදන

2.3.1 ජංගම වගකීම්

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනවල ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කරන ලද වගකීම්, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දිනයෙන් පසුව වර්ෂයක් ඇතුළත ගෙවීමට ඇති වගකීම් වේ. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී සියලුම දන්නා වගකීම් සැලකිල්ලට ගෙන ඇත.

2.3.2 විලම්බිත ආදායම

මාස කිහිපයක කාලයක් තුළ පාඨමාලා පවත්වන විට, පාඨමාලා සහ අධ්‍යයන වැඩසටහන්වලට සම්බන්ධ අදාළ ලැබීම් පාඨමාලා ආරම්භයේ දී එකතු කරන විට, විලම්බිත ආදායම ඇති වේ. විලම්බිත ආදායම පාඨමාලාව ක්‍රියාත්මක කරනු ලබන කාල සීමාව දක්වා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගනු ලබන අතර, පාඨමාලාවේ ඉතිරි කාලපරිච්ඡේදයට අදාළ ශේෂය, ආදායම හඳුනා ගන්නා තෙක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ වගකීමක් ලෙස හඳුනා ගැනේ.

2.3.3 විශ්‍රාම ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම

සේවක ප්‍රතිලාභ

(අ) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂිකය

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වලින් සියලුම සේවකයින් සිය විශ්‍රාමයේ දී ලැබෙන ප්‍රතිලාභවල අගය ඇස්තමේන්තු කරනු ලැබේ. විශ්වවිද්‍යාලය 1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ පාරිතෝෂික ගෙවීම යටතේ නියම කර ඇති ප්‍රතිලාභ සැලසුම සියලුම සුදුසුකම් සපුරා ඇති සේවකයින් සඳහා භාවිතා කරනු ලැබේ.

එය සේවකයාගේ වයස, සේවා කාලය සහ වන්දි වැනි සාධක මත තීරණය වේ. මෙම වගකීම සම්පූර්ණ කිරීම පිණිස වාර්තාකරන දිනයට ප්‍රතිපාදනයක් ඉදිරියට ගෙන යනු ලබන අතර අභ්‍යන්තර කළමනාකරණ ඇගයීමක් මත මුදල් අගය ගණනය කර ඇත. ඒ අනුව, වාර්තාකරන දිනයට විශ්වවිද්‍යාල පද්ධතිය තුළ වසර 1ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයින් සඳහා වගකීම හඳුනා ගන්නා ලදි. කාලසීමාව ආරම්භයේ දී ඉදිරියට ගෙන යන ප්‍රතිපාදන සහ කාලසීමාව අවසානයේ දී ඉදිරියට ගෙන ගිය ප්‍රතිපාදනය අතර වෙනස ලාභ අලාභ ප්‍රකාශනයේ දක්වා ඇත.

පාරිතෝෂික වගකීම සඳහා බාහිරව අරමුදල් සපයනු නොලබන අතර ජීව ගණක තක්සේරුවක් සිදු නොවේ.

(ආ) නිශ්චිත දායකත්ව සැලසුම්

නිශ්චිත දායකත්ව සැලසුම පසු සේවානියුක්ති සැලසුමක් වන අතර එක් ආයතනයක් මඟින් වෙනත් ආයතනයකට ස්ථාවර දායකත්වයක් ගෙවීමෙන් සිදු වන අතර වැඩිපුර මුදලක් ගෙවීම සඳහා කිසිදු නෛතික හෝ සම්ප්‍රයුක්ත බැඳියාවක් නොමැත. නිශ්චිත දායකත්ව සැලසුමට දායකත්වය දැක්වීම සඳහා වූ බැඳියාව එය ගෙවිය යුතු වන අවස්ථාවේ දී විස්තීර්ණ ආදායම පිළිබඳ ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනා ගෙන ඇත.

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල (UPF) සහ විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදල

ශ්‍රී ලංකාව තුළ අදාළ නීති, ව්‍යවස්ථා සහ විශ්වවිද්‍යාල පනතේ ප්‍රතිපාදන අනුව විශ්වවිද්‍යාලය සහ සේවකයින් සිය දළ වැටුප මත පදනම්ව පිළිවෙලින් 7% ක් සහ 10% බැගින් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට දායක වේ. තව ද, විශ්‍රාම වැටුප් හිමි සේවකයින් සඳහා විශ්වවිද්‍යාලය මඟින් විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදල සඳහා 8% ක් දායක වේ.

සේවක භාරකාර අරමුදල (ETF)

විශ්වවිද්‍යාලය සෑම සේවකයෙක්ගේම දළ වැටුපෙන් 3% කින් සේවක භාරකාර අරමුදලට දායක වේ.

2.3.4 අසම්භාව්‍ය බැරකම්

නඩු පැවරීමෙන් පැන නගින වගකීම් සම්බන්ධයෙන් ගිණුම්වල ප්‍රතිපාදන නොමැත. 2022 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත මුළු වගකීම් ප්‍රමාණය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දක්වා ඇත.

2.4 සමකොටස්

2.4.1 ප්‍රාග්ධන ප්‍රදාන

ප්‍රදානය ලැබෙනු ඇති බවට සාධාරණ සහතිකයක් ලැබෙන අතර බලපාන සියලු කොන්දේසිවලට අනුකූල විය හැකි බවට සහතික විය හැකි අවස්ථාවල රජයේ ප්‍රදාන ඒවායේ සාධාරණ වටිනාකමින් හඳුනා ගැනේ. ස්ථාවර වත්කම් මිල දී ගැනීම සඳහා රජයේ ප්‍රදාන සහ වෙනත් ආයතනවලින් සිදු කළ දායකත්වයන් පළමු අවස්ථාවේදීම කලින් ලැබුනු ප්‍රදාන ලෙස හඳුනා ගනු ලැබේ. වත්කම් මිලදී ගැනීම සඳහා ප්‍රදාන උපයෝජනය කිරීම මත ඒවා වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදානවලට ඇතුළත් කරන අතර ඒවා ප්‍රාග්ධනීයකරණය හෝ වියදම් කළ වත්කම් මිල දී ගැනීම සඳහා ආදායමට හෝ වියදමට ඇතුළත් කරනු ලැබේ.

2.4.2 පුනරාවර්තන ප්‍රදාන

පුනරාවර්තන ප්‍රදාන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ මූදල් පදනම මත හඳුනා ගනී. වාර්තාකරන මූල්‍ය වර්ෂය තුළ ලැබූ පුනරාවර්තන ප්‍රදාන පහත දක්වා ඇත.

වර්ෂය	**2022** (රු.)	**2021** (රු.)
පුද්ගල පඩිනඩි	17,475,000.00	15,413,000.00
වෙනත් පුනරාවර්තන	3,800,000.00	4,364,000.00
මුළු පුනරාවර්තන ප්‍රදාන	21,275,000.00	19,777,000.00

ප්‍රදාන ගිණුම්ගත කිරීම

විශ්වවිද්‍යාලය දරනු ලබන වියදම් සඳහා ලැබෙන ප්‍රදාන, එම වියදම හඳුනා ගන්නා කාලපරිච්ඡේදය තුළ දීම ආදායම් ප්‍රකාශනයේ ආදායමක් ලෙස හඳුනා ගනී. වත්කමක පිරිවැය සඳහා විශ්වවිද්‍යාලයට ලැබුන ප්‍රදාන අදාළ වත්කමේ ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරාවට ක්‍රමානුකූල පදනමක් මත ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගනී. එසේම ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්කරණය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් අංක 11 යොදා ගන්නා ලදී.

2019 වර්ෂය තුළ දී උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබුනු මූලික ප්‍රාග්ධන ප්‍රදානය රු. 7,000,000.00 ක් වන අතර 2019 වාර්ෂික අයවැය අනුව භාණ්ඩාගාරයෙන් ලැබුනු ප්‍රාග්ධන ප්‍රදානය රු. 6,100,000.00ක් විය. මෙම ප්‍රදාන දෙක 2019 ලැබුනු ප්‍රාග්ධන ප්‍රදාන ලෙස වෙන් වෙන්ව හඳුනා ගෙන ක්‍රමක්ෂය කරන ලදී.
මෙයට අමතරව, 2019 වර්ෂයේ දී කොළඹ විශ්වවිද්‍යාලයෙන් මාරු කළ වත්කම් මත පදනම්ව MOHEවලින් ලැබූ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස රු. 2,115,466.97 ක් හඳුනා ගෙන, ඒ මත ක්‍රමක්ෂය කර ඇත.

වාර්තාකරණ මූල්‍ය වර්ෂය තුළ දී භාණ්ඩාගාරයෙන් ලැබුනු ප්‍රාග්ධන ප්‍රදාන පහත දක්වා ඇත.

වර්ෂය	2022 (රු.)	2021 (රු.)
ස්ථාවර වත්කම් අත්කර ගැනීම	-	3,000,000.00

2.5 විස්තීර්ණ ආදායම පිළිබඳ ප්‍රකාශනය

2.5.1 ආදායම හඳුනාගැනීම

ගෙවීම් සිදු කළ දිනය නොසලකා, ආයතනය තුළට ආර්ථික වාසි ගලා ඒමේ හැකියාව සහ ආදායම විශ්වාසදායක ලෙස මැනිය හැකිවීම මත ආදායම හඳුනා ගනී. ආදායම හඳුනා ගැනීමට පෙර පහත දැක්වෙන නිශ්චිත හඳුනා ගැනීමේ නිර්ණායක ද සම්පූර්ණ කළ යුතු වේ.

01. පාඨමාලාවලින් ආදායම

විශේෂඥ වෛද්‍ය විද්‍යා උපාධි පාඨමාලාවලින් ලැබුනු ආදායම කාලපරිච්ඡේද පදනම මත ආදායම ලෙස හඳුනා ගනී. 2020 වර්ෂයේ දී විශේෂඥ වෛද්‍ය විද්‍යා උපාධි පාඨමාලා 5ක් ආරම්භ කර ඇත. ලියාපදිංචි ගාස්තුව, පාඨමාලා ගාස්තුව සහ වෙනත් ගාස්තු ලෙස 2022 වර්ෂය තුළ දී ලැබුනු මුදල රු. 2,940,501.00 ක් වන අතර 2021 වර්ෂයේ දී උත්පාදිත ආදායම ලෙස හඳුනා ගෙන ඇති මුදල රු. 2,991,000.00 ක් වේ.

02. පොලී ආදායම

පොලී ආදායම උපචිත පදනම මත හඳුනා ගනී. පොලී ආදායමට ස්ථාවර තැන්පතු ආයෝජනවලින් ලැබිය යුතු පොලී ආදායම මෙන්ම අරමුදල් කළමනාකරණ ගිණුම්වලින් ලැබෙන පොලී ආදායම ඇතුළත් වේ.

03. වෙනත් ආදායම

ඉහත කාණ්ඩ යටතේ නිශ්චිතව දක්වා නොමැති වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

2.5.2 වියදම් හඳුනා ගැනීම

ආයතනයේ සියලුම කටයුතු සිදු කිරීම සම්බන්ධ උපචිත පදනම මත හඳුනා ගෙන ඇති අතර ඒවා සිදු වූ කාලසීමාව තුළ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට ඇතුළත් කරනු ලැබේ.

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 2019 වර්ෂයේ දී ස්ථාපිත කරන ලද අතර කාර්යාලය බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහලේ 5වැනි මහලේ පිහිටුවා ඇත. ආරම්භයේ සිට මේ දක්වාම විදුලිය සහ ජලය සඳහා වූ බිල්පත් ආයුර්වේද ශික්ෂණ රෝහල මඟින් ගෙවා ඇත.

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් භාවිතා කරන කාර්යාලට සම්බන්ධ විදුලිය සහ ජල බිල්පත්වලට අදාළ මුදල් අගයන් 2022 අගෝස්තු මස අවසානය වන තෙක් ඉදිරිපත් කර නොතිබුනු බැවින් ඒවා ආයුර්වේද ශික්ෂණ රෝහල වෙත ආපසු ගෙවා නොමැත. 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය සඳහා පිළිවෙලින් ජලය සහ විදුලිය සඳහා රු.480,000.00 සහ රු. 1,230,000.00 බැගින් වෙන්කර ඇත (උපචිත වියදම් සඳහා වෙන්කිරීම්). කෙසේවුව ද, 2022 අගොස්තු මාසයේ දී 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය සඳහා පිළිවෙලින් ජලය සහ විදුලිය වෙනුවෙන් රු.42,643.80 සහ රු.3,739,324.38 ක් ගෙවීම සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුව දැනුම් දී ඇත. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය කමිටුවේ දී මෙම කරුණ සාකච්ඡා කරන ලද අතර මාසික විදුලි ගාස්තු ගණනය කිරීම සඳහා භාවිතා කළ පදනම පිළිබඳව ආයුර්වේද දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කිරීමට තීරණය කරන ලදී. ආයුර්වේද දෙපාර්තමේන්තුව භාවිතා කළ පදනම සම්බන්ධයෙන් තාක්ෂණික දෝෂ ගණනාවක් ඇති බවට පෙනී යන බැවින් ගෙවියයුතු මුදල පිළිගත හැකි අගයක් දක්වා අඩු කර ගත හැකිය. ඒඅනුව 2022 වර්ෂය සඳහා ද විදුලිය සඳහා රු. 500,000.00ක් වෙන් කර ඇත. හිමිකම්පාන මුදල ජලය සඳහා වෙන්කර ඇත. ආයුර්වේද දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා නිමා කිරීමෙන් අනතුරුව විදුලිය සහ ජලය සඳහා දක්වා ඇති ඌන හෝ අධික වෙන්කිරීම් සඳහා වූ ගැලපීම් 2023 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී සිදු කිරීමට නියමිත වේ.

2.6 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් 2ට අනුකූලව වක්‍ර ක්‍රමය භාවිතා කරමින් සකස් කර ඇති අතර එහි දී දළ මුදල් ලැබීම් සහ මෙහෙයුම් ක්‍රියාකාරකම්වල දළ මුදල් ගෙවීම් මූල්‍ය කටයුතු සහ ආයෝජන ක්‍රියාකාරකම් හඳුනා ගෙන ඇත.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් -11 (SLPSAS-11) 2022.01.01 සිට ක්‍රියාත්මක වන පරිදි භාණ්ඩාගාරයෙන් ලැබූ ප්‍රාග්ධන ප්‍රදාන හඳුනා ගැනීමට අදාළ කර ගෙන ඇත. ඒ අනුව, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, සමකොටස්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 2021 වර්ෂය සඳහා ගලපා ඇත.

2.7 වගකීම් සහ අවිනිශ්චිතතා

දන්නා සියලුම වගකීම් ප්‍රමාණය තීරණය කිරීමේ දී සියලුම අවදානම් ගණන් ගනු ලැබේ. අවිනිශ්චිත වගකීම් යනු අවිනිශ්චිත අනාගත සිදුවීම් මත තීරණය වන හෝ ආර්ථික ප්‍රතිලාභ මාරු කිරීමේ සම්භාවිතාවක් නොමැති හෝ විශ්වාසදායක ලෙස මැනිය නොහැකි වත්මන් වගකීම් මඟින් පමණක් තහවුරු කළ හැකි බැඳීම් වේ. අවිනිශ්චිත වගකීම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ හඳුනා නොගන්නා නමුත් ඒවා දුරස්ථ නම් මිස අනාවරණය කරනු ලැබේ.

2.8 වාර්තාකරණ දිනයෙන් පසු සිදු වූ සිදුවීම්

වාර්තාකරණ දිනයෙන් පසු සිදු වූ සියලුම සැලකිය යුතු අවස්ථා සැලකිල්ලට භාජනය කර ඇති අතර මූල්‍ය ප්‍රකාශනයන්හි අවශ්‍ය තැන්වල දී සුදුසු ගැලපීම් සිදු කර ඇත.

සටහන 03 මුදල් හා මුදල් සමාන දෑ	2022 රු.	2021 රු.
BOC බොරැල්ල SG ගිණුම් අංකය: 0084061028 - පුනරාවර්තන	3,971,006	4,099,943
BOC බොරැල්ල SG ගිණුම් අංකය: 0084060859 - ප්‍රාග්ධන	217,681	487,650
BOC බොරැල්ල SG ගිණුම් අංකය: 0085283375 - අරමුදල් කළමනාකරණ ගිණුම	8,978,030	11,809,163
	13,166,716	**16,396,756**

සටහන 04 ස්ථාවර තැන්පතුවල ආයෝජන	2022 රු.	2021 රු.
BOC බොරැල්ල SG ගිණුම් අංකය: 86766165	-	523,201
BOC බොරැල්ල SG ගිණුම් අංකය: 86766175	-	523,201
BOC බොරැල්ල SG ගිණුම් අංකය: 86766156	-	523,201
BOC බොරැල්ල SG ගිණුම් අංකය: 88304410	-	1,870,000
BOC බොරැල්ල SG ගිණුම් අංකය: 89452154	1,870,000	-
මහජන බැංකුව බොරැල්ල ගිණුම් අංකය 078-6001-000014506-3	531,164	-
මහජන බැංකුව බොරැල්ල ගිණුම් අංකය 078-6001-000014505-4	531,164	-
මහජන බැංකුව බොරැල්ල ගිණුම් අංකය 078-6001-000014504-5	531,164	-
	3,463,493	**3,439,604**

සටහන 05 ලැබිය යුතු දෑ	2022 රු.	2021 රු.
පූර්ව ගෙවීම්	113,467	19,016
පාඨමාලා ගාස්තු ලැබීම්	416,668	333,333
පොලී ආදායම ලැබීම්	139,891	4,730
වෙනත් ලැබිය යුතු දෑ	71,351	-
	741,378	**357,080**

සටහන 06 කාර්ය මණ්ඩලයට ණය සහ අත්තිකාරම්	2023 අතරතුර දී ආපසු අය කර ගැනීම්	2023 පසුව ආපසු අය කර ගැනීම්	2022 රු.	2021 රු.
ආපදා ණය	123,570	410,990	534,560	261,667
පරිගණක ණය	12,000	37,500	49,500	14,500
වාහන ණය	10,008	6,632	16,640	58,000
කාර්ය මණ්ඩල ණය	1,700	6,800	8,500	-
	147,278	**461,922**	**609,200**	**334,167**

සටහන 07 අත්තිකාරම්	2022 රු.	2021 රු.
විවිධ අත්තිකාරම්	-	11,307
මුද්දර අග්‍රිමය	2,284	7,825
	2,284	**19,132**

සටහන 08 බඩු ලේඛන/ තොග	2022 රු.	2021 රු.
තොග	489,723	463,551
	489,723	**463,551**

සටහන 09

දේපළ පිරියත සහ උපකරණ **රු.**

<u>පිරිවැය</u>

විස්තරය	2020.01.01ට ශේෂය	එකතු කිරීම්	ඉවත් කිරීම්/ ගැලපීම්	2022.12.31ට ශේෂය
කාර්යාල හා ඉගැන්වම් උපකරණ	3,183,646	143,858		3,327,504
පරිගණක හා පරිගණක මෙවලම්	1,384,967	-		1,384,967
ගෘහභාණ්ඩ හා සවිකිරීම්	3,039,900	1,494,737		4,534,638
පුස්තකාල පොත්	-	2,161,382		2,161,382
සවිකිරීම් හා උපාංග	-	172,901		172,901
එකතුව	**7,608,513**	**3,972,879**	**-**	**11,581,392**

<u>ක්ෂයවීම් සඳහා වෙන්කිරීම්</u>

විස්තරය	%	**2022.01.01** දිනට ශේෂය	**වර්ෂය සඳහා ගාස්තුව**	**ඉවත් කිරීම්/ ගැලපීම්**	**2022.12.31** දිනට ශේෂය
කාර්යාල හා ඉගැන්වීම් උපකරණ	10	647,971	332,161		980,132
පරිගණක හා පරිගණක මෙවලම්	20	863,551	294,960		1,158,511
ගෘහභාණ්ඩ හා සවිකිරීම්	10	778,987	360,353		1,139,341
පුස්තකාල පොත්	20	-	209,741		209,741
සවිකිරීම් සහ උපාංග	10	-	9,209		9,209
එකතුව		**2,290,509**	**1,206,424**	**-**	**3,496,933**

<u>ලියා හල අගය</u>

විස්තරය	**2022.01.01** දිනට ශේෂය	**2022.12.31** දිනට ශේෂය
කාර්යාල හා ඉගැන්වීම් උපකරණ	2,535,675	2,347,372
පරිගණක හා පරිගණක මෙවලම්	521,417	226,457
ගෘහභාණ්ඩ හා සවිකිරීම්	2,260,913	3,395,297
පුස්තකාල පොත්	-	1,951,642
සවිකිරීම් සහ උපාංග	-	163,693
එකතුව	**5,318,004**	**8,084,459**

සටහන 10

අස්පෘශ්‍ය වත්කම්

රු.

පිරිවැය

විස්තරය	**2022.01.01 දිනට ශේෂය**	**එකතු කිරීම්**	**ඉවත් කිරීම්/ ගැලපීම්**	**2022.12.31 දිනට ශේෂය**
වෙබ් අඩවිය සංවර්ධනය	-	65,000		65,000
එකතුව	**-**	**65,000**	**-**	**65,000**

ක්‍රමක්ෂය සඳහා වෙන් කිරීම්

විස්තරය	%	**2022.01.01 දිනට ශේෂය**	**වර්ෂය සඳහා ගාස්තුව**	**ඉවත් කිරීම්/ ගැලපීම්**	**2022.12.31 දිනට ශේෂය**
වෙබ් අඩවිය සංවර්ධනය	20		4,808		4,808
එකතුව		**-**	**4,808**	**-**	**4,808**

ලියා හල අගය

විස්තරය	**2022.01.01 දිනට ශේෂය**	**2022.12.31 දිනට ශේෂය**
වෙබ් අඩවිය සංවර්ධනය	-	60,192
එකතුව	**-**	**60,192**

සටහන 11	**2022**	**2021**
සමුච්චිත වියදම්	**රු.**	**රු.**
සමුච්චිත විදයම් -පුනරාවර්තන	3,936,727	3,804,182
එකතුව	**3,936,727**	**3,804,182**

සටහන 12	**2022**	**2021**
ගෙවිය යුතු දෑ	**රු.**	**රු.**
ණයකරුවෝ	816,750	926,000
රඳවා ගැනීම්	259,268	95,850
ගෙවිය යුතු මුද්දර ගාස්තු	-	500
ගෙවිය යුතු රැස්වීම් දීමනාව	-	-
ගෙවිය යුතු පුස්තකාල පොත් ගාස්තු	55,000	-
එකතුව	**1,131,018**	**1,022,350**

සටහන 13			2022		2021
විශ්‍රාම පාරිතෝෂිකය සඳහා ගෙවීම්			රු.		රු.
ජනවාරි 01වැනි දිනට ශේෂය			1,505,304		1,369,603
වර්ෂය සඳහා ගාස්තුව			59,726		135,701
			1,565,030		1,505,304
වර්ෂය තුළ කළ ගෙවීම්			-		-
දෙසැම්බර් මස 31 වැනි දිනට ශේෂය			**1,565,030**		**1,505,304**

සටහන 14			2022		2021
වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන			රු.		රු.
ආරම්භක ශේෂය			-		-
මාරුකිරීම්			4,037,879		534,795
ගැලපීම්			-		
ක්‍රමක්ෂය			(4,037,879)		(534,795)
			-		**-**

සටහන 15			2022		2021
වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන			රු.		රු.
ආරම්භක ශේෂය			4,887,453		2,422,248
වර්ෂය අතරතුර දී එකතු කිරීම්			-		3,000,000
මාරු කිරීම්			(4,037,879)		(534,795)
			849,575		**4,887,453**

සටහන 16			2022		2021
MOHEවලින් ප්‍රාග්ධන ප්‍රදාන			රු.		රු.
ආරම්භක ශේෂය			8,047,199		7,000,000
ගැලපීම්			(1,047,199)		-
ක්‍රමක්ෂය			-		-
			7,000,000		**7,000,000**

සටහන 17 සමුච්චිත අතිරික්තය හා හිඟය	2022 රු.	2021 රු.
ජනවාරි මස 01වැනි දිනට ශේෂය	7,584,003	5,797,935
ගැලපීම් (පෙර වර්ෂය)	555,919	-
කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/(හිඟය)	2,636,838	1,786,068
දෙසැම්බර් 31වැනි දිනට ශේෂය	**10,776,761**	**7,584,003**

සටහන 18 උත්පාදිත ආදායම	2022 රු.	2021 රු.
විශේෂඥ උපාධි ලියාපදිංචි ගාස්තුව	60,000	11,000
විශේෂඥ උපාධි පාඨමාලා ගාස්තුව	2,450,001	2,050,000
විභාග ගාස්තු	235,000	60,000
අධ්‍යයන මණ්ඩල සහතිකකරණ වරප්‍රසාද ගාස්තු	50,000	870,000
අයැදුම්පත්‍ර ගාස්තුව	33,500	-
පර්යේෂණ යෝජනා ඇගයීම් ගාස්තුව	90,000	-
පුස්තකාල ගාස්තුව (ආපසු ගෙවනු නොලබන)	22,000	-
එකතුව	**2,940,501**	**2,991,000**

සටහන 19 වෙනත් ආදායම	2022 රු.	2021 රු.
ණය හා අත්තිකාරම්වලින් පොළිය	16,117	22,525
අරමුදල් කළමණාකරණ ගිණුමෙන් පොළිය	923,457	176,071
ස්ථිර තැන්පතුවලින් පොළිය	345,492	70,051
වෙනත් ආදායම්	3,780	-
එකතුව	**1,288,846**	**268,647**

සටහන 20 ක්‍රමක්ෂය ආදායම්	2022 රු.	2021 රු.
ක්‍රමක්ෂය ආදායම් - රජයේ ප්‍රාග්ධන ප්‍රදාන (වත්කම්)	-	513,966
ක්‍රමක්ෂය ආදායම් - MOHEවලින් ප්‍රාග්ධන ප්‍රදාන (වත්කම්)	-	356,089
එකතුව	**-**	**870,055**

මුළු වියදම

සටහන 21 - අ **සේවක පඩිනඩි**	**2022** **රු.**	**2021** **රු.**
<u>අධ්‍යයන</u>		
වැටුප් හා වේතන	2,470,417	1,736,079
විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල	450,804	377,702
විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදල	515,205	381,106
සේවක භාරකාර අරමුදල	193,202	142,915
අධ්‍යයන දීමනා	3,782,440	2,872,888
සංග්‍රහ දීමනා	217,260	135,691
වෙනත් දීමනා	101,000	385,143
බාහිර කථිකාචාර්ය ගාස්තු	447,600	940,600
පර්යේෂණ දීමනා	864,646	623,127
ජීවන වියදම් දීමනා	187,200	110,574
වැඩබැලීමේ ගාස්තු	-	29,338
අතිරේක දීමනා 20%	494,083	356,073
අතිරේක 5000 දීමනාව 2022	120,000	-
පාරිතෝෂිකය	2,444	-
එකතුව	**9,846,300**	**8,091,235**
<u>අනධ්‍යන</u>		
වැටුප් හා වේතන	4,279,160	3,450,278
විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල	359,392	340,697
විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදල	410,734	389,368
සේවක භාරකාර අරමුදල	154,025	146,013
වැඩබැලීමේ ගාස්තු	33,090	-
මාසික හිලව් දීමනාව	1,406,150	1,349,251
නිවාඩු ගෙවීම්	7,152	31,583
පාරිතෝෂිකය	57,283	135,701

අතිකාල	7,288	16,322
වෙනත් දීමනා	32,645	97,387
පර්යේෂණ දීමනා	412,099	589,554
ජීවන වියදම් දීමනා	603,242	519,518
අතිරේක දීමනා 20%	624,956	599,667
2022 අතිරේක දීමනා රු 5000	386,694	-
එකතුව	**8,773,910**	**7,665,339**
එකතුව	**18,620,210**	**15,756,574**

සටහන 21-ආ		2022		2021
ගමන්වියදම් හා යැපීම් දීමනා		රු.		රු.
දේශීය		26,820		90,302
එකතුව		**26,820**		**90,302**
සටහන 21 -ඇ		**2022**		**2021**
සැපයුම් හා පාරිභෝගික භාණ්ඩ		රු.		රු.
ලිපි ලේඛන හා කාර්යාල අවශ්‍යතා		427,019		256,011
ඉන්ධන හා ලිහිසි තෙල්		720,748		223,069
යාන්ත්‍රික හා විදුලි භාණ්ඩ		6,000		20,055
වෛද්‍ය සැපයුම්		-		21,195
වෙනත් සැපයුම්		150		4,744
එකතුව		**1,153,917**		**525,074**
සටහන 21 - ඈ		**2022**		**2021**
නඩත්තු වියදම්		රු.		රු.
පිරියත, යන්ත්‍රසූත්‍ර හා උපකරණ		51,060		42,432
ගොඩනැගිලි හා ව්‍යුහය		67,417		32,014
එකතුව		**118,477**		**74,446**
සටහන 21 - ඉ		**2022**		**2021**
කොන්ත්‍රාත් සේවා		රු.		රු.
විදුලිසංදේශ		174,955		139,353
තැපැල් ගාස්තු		33,127		29,725
විදුලිය		500,000		300,000
ආරක්ෂක සේවාව		274,961		184,165
ජලය		15,748		100,000
පිරිසිදු කිරීමේ සේවාව		342,370		129,168
කුලිය හා කුලී ගාස්තු		1,540,000		900,000
මුද්‍රණය හා දැන්වීම් ප්‍රචාරණය		38,856		559,757
එකතුව		**2,920,015**		**2,342,167**
සටහන 21 - ඊ		**2022**		**2021**
වෙනත් පුනරාවර්තන වියදම්		රු.		රු.
විශේෂ සේවාව - පාලක සභාව හා කමිටු		1,909,319		1,510,708
වැඩමුළු හා සම්මන්ත්‍රණ		3,000		-

විශේෂ සේවාව - වෘත්තීය හා වෙනත් ගාස්තු		459,303		251,962
කාර්ය මණ්ඩල සංවර්ධනය හා පුහුණුව		44,070		41,500
දේපළ ණය මත පොලී සහනාධාරය		90,945		182,485
නිවාඩු බලපත්‍ර සහ වාරප්‍රවේශපත්‍ර		4,500		-
බැංකු ගාස්තු		4,425		4,250
දායකත්ව හා සාමාජික ගාස්තු		16,000		16,000
විභාග ගාස්තු		78,555		119,850
වෙනත්		244,600		-
එකතුව		**2,854,716**		**2,126,755**

සටහන 21 -උ	**2022**	**2021**
ක්ෂයවීම	**රු.**	**රු.**
ක්ෂය - කාර්යාල හා ඉගැන්වීමේ උපකරණ	332,161	272,240
ක්ෂය - ගෘහභාණ්ඩ හා සවිකිරීම්	360,353	305,198
ක්ෂය - පරිගණක හා පරිගණක මෙවලම්	294,960	292,617
ක්ෂය - පුස්තකාල පොත්	209,741	-
ක්ෂය - සවිකිරීම් සහ උපාංග	9,209	-
ක්‍රමක්ෂය - අස්පෘශ්‍ය වත්කම්	-	-
එකතුව	**1,206,424**	**870,055**

සටහන 21 -ඌ	**2022**	**2021**
ක්‍රමක්ෂය - අස්පෘශ්‍ය වත්කම්	**රු.**	**රු.**
වෙබ් අඩවි සංවර්ධනය	4,808	-
එකතුව	**4,808**	**-**

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය

2022 දෙසැම්බර් 31 වැනි දිනට ශේෂ පිරික්සුම

කේතය සහ ගිණුමේ නම	**බැර**	**හර**
30010 - පාරිතෝෂිකය සඳහා වෙන්කිරීම		1,565,030.38
30100 - ණයහිමියෝ		816,750.44
30110 - සමුච්චිත වියදම් - පුනරාවර්තන		3,936,726.51
30120 - ගෙවිය යුතු මුද්දර ගාස්තු		-
30140 - ගෙවිය යුතු PAYE බද්ද		-
30130 - රඳවා ගැනීම්		259,267.50
30150 - ගෙවී යුතු රැස්වීම් දීමනාව		-
30160 - ක්ෂයවීම සඳහා වෙන්කිරීම කාර්යාල හා ශික්ෂණ උපකරණ		980,131.75
30170 - ක්ෂයවීම සඳහා වෙන්කිරීම පරිගණක හා පරිගණක උපාංග		1,158,510.91
30180 - ක්ෂයවීම සඳහා වෙන්කිරීම ගෘහභාණ්ඩ හා සවිකිරීම්		1,139,340.86
30181 - ක්ෂයවීම සඳහා වෙන්කිරීම පුස්තකාල පොත්		209,740.62
30182 - ක්ෂයවීම සඳහා වෙන්කිරීම සවිකිරීම් සහ උපාංග		9,208.55
30183 - අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය සඳහා වෙන්කිරීම		4,808.22
30190 - විලම්බිත ආදායම විශේෂඥ වෛද්‍ය පාඨමාලා ගාස්තුව		1,358,333.33
30200 - ආපසු ගෙවනු ලබන පුස්තකාල ගාස්තුව		55,000.00
20010 - ඉඩම්	-	
20020 - ගොඩනැගිලි	-	
20030 - පිරිවිත හා යන්ත්‍රෝපකරණ	-	
20040 - මෝටර් රථ	-	
20050 - ගෘහභාණ්ඩ හා සවිකිරීම්	4,534,637.51	
20060 - කාර්යාල හා ශික්ෂණ උපකරණ	3,327,503.54	
20070 - පරිගණක හා පරිගණක උපාංග	1,384,967.44	
20080 - වෙනත්	-	
20090 - පුස්තකාල පොත්	2,161,382.18	
20100 - පරිගණක මෘදුකාංග	65,000.00	
20110 - තිරවුරු හා සවිකිරීම්	172,901.40	
20180 - උත්සව අත්තිකාරම	-	
20190 - විශේෂ අත්තිකාරම	-	
20200 - බඩු ලේඛන	489,723.32	
20210 - ආපදා ණය	534,560.00	
20220 - ප්‍රවාහන ණය	16,640.00	
20230 - පරිගණක ණය	49,500.00	
20231 - කාර්ය මණ්ඩල ණය	8,500.00	
20235 - ලැබිය යුතු පොලී ආදායම	139,891.37	

20240 - අත්තිකාරම	-	
20240A - ප්‍රාග්ධන අත්තිකාරම්	-	
20240B - වැටුප් අත්තිකාරම්	-	
20245 -සුළු මුදල් අග්‍රිමය	-	
20250 - BOC බොරැල්ල SG ගිණුම් අංකය 0084061028 - පුනරාවර්තනය	3,971,005.63	
20260 - BOC බොරැල්ල SG ගිණුම් අංකය 0084060859 - ප්‍රාග්ධනය	217,680.50	
20270 - BOC බොරැල්ල SG ගිණුම් අංකය 0085283375 - අරමුදල් කළමනාකරණ ගිණුම	8,978,029.50	
20280 - ස්ථාවර තැන්පතු ආයෝජනය - BOC බොරැල්ල SG	3,463,493.14	
20285 - මුද්දර අග්‍රිමය	2,283.50	
20295 - පූර්ව ගෙවීම	113,467.35	
20300 - ලැබිය යුතු පාඨමාලා ගාස්තු	416,667.67	
20310 - වෙනත් ලැබීම්	71,351.26	
10010 - වැටුප් හා වේතන	2,470,417.00	
10020 - විඅඅ (UPF)	450,803.98	
10030 - විශ්‍රාම වැටුප්	515,204.53	
10040 – සේඅඅ (ETF)	193,201.73	
10050 - වැඩබැලීමේ ගාස්තු	-	
10060 - අධ්‍යයන ගාස්තු	3,782,439.55	
10070 - අතිරේක ගාස්තු 2022	120,000.00	
10080 - බාහිර කටිකාවාර ගාස්තු	432,000.00	
10090 - ජීවන වියදම් දීමනාව	187,200.00	
10110 - වෙනත් දීමනා	101,000.00	
10120 - පාරිතෝෂිකය	2,443.59	
10130 - පර්යේෂණ දීමනාව	864,645.95	
10160 - 20% විශේෂ දීමනාව	494,083.40	
10180 - සංග්‍රහ දීමනාව	217,260.00	
10190 - දත්ත ගාස්තු	15,600.00	
10510 - වැටුප් හා වේතන	4,279,160.43	
10520 - විප්‍රඅ (UPF)	359,392.10	
10530 - විශ්‍රාම වැටුප	410,733.66	
10540 - සේඅඅර (ETF)	154,025.25	
10550 - වැඩබැලීමේ ගාස්තු	33,090.00	
10560 - අතිකාල ගෙවීම්	7,288.29	
10570 - නිවාඩු ගෙවීම්	7,152.00	
10580 - අතිරේක දීමනා 2022	386,693.55	
10690 - සංග්‍රහ දීමනාව	-	
10590 - ජීවන වියදම් දීමනාව	603,241.93	
10600 - 20% වැටුප් දීමනාව	-	
10630 - සමානකිරීමේ දීමනාව	-	

10610 - වෙනත් දීමනා	32,645.16	
10620 - පාරිතෝෂික	57,282.79	
10680 - පර්යේෂණ දීමනාව	412,098.75	
10650 - 20% විශේෂ දීමනාව	624,955.70	
10670 - අන්තර්කාලීන දීමනාව	-	
10690 - 45 % මාසික වන්දි දීමනාව	1,406,150.33	
10700 - ගැලපුම් දීමනාව	-	
11010 - දේශීය ගමන් වියදම්	26,819.98	
11020 - විදේශීය ගමන් වියදම්	-	
12010 - ලිපිද්‍රව්‍ය හා කාර්යාල උපකරණ	427,019.18	
12020 - ඉන්ධන හා ලිහිසි ද්‍රව්‍ය	720,747.50	
12030 - නිල ඇඳුම්	-	
12040 - යාන්ත්‍රික හා ඉලෙක්ට්‍රොනික භාණ්ඩ	-	
12050 - රසායනික ද්‍රව්‍ය හා වීදුරු භාණ්ඩ	-	
12060 - වෛද්‍ය සැපයුම්	6,000.00	
12070 - වෙනත් වියදම්	150.00	
13010 - වාහන	-	
13020 - පිරියත, යන්ත්‍රසූත්‍ර හා උපකරණ	51,060.23	
13030 - ගොඩනැගිලි හා ව්‍යුහයන්	67,417.00	
13040 - ගෘහභාණ්ඩ	-	
14010 - ප්‍රවාහනය	-	
14020 - විදුලිසංදේශ	174,954.51	
14030 - තැපැල් ගාස්තු	33,126.50	
14040 - විදුලිය	500,000.00	
14050 - ආරක්ෂක සේවා	274,961.16	
14060 - ජලය	15,747.50	
14070 - පිරිසිදු කිරීමේ සේවා	342,370.00	
14080 - කුලී ගාස්තු	1,540,000.00	
14090 - පළාත් පාලන ආයතන වරිපණම් හා බදු	-	
14100 - මුද්‍රණය හා දැන්වීම් ප්‍රචාරණය ආදිය	38,855.70	
14110 - වෙනත්	-	
15010 - විශ්වවිද්‍යාල ගුරුවරු සඳහා ගමන් ප්‍රදාන	-	
15020 - විශේෂ සේවා - පාලක සභාව හා කමිටු	1,909,318.90	
15030 - විශේෂ සේවා - වෘත්තීය හා වෙනත් ගාස්තු	459,303.12	
15040 - වැඩමුළු, සම්මන්ත්‍රණ	3,000.00	
15050 - අධ්‍යයන පර්යේෂණ හා ප්‍රකාශන	-	
15060 - කාර්ය මණ්ඩල සංවර්ධනය (පුහුණුව)	44,070.00	
15070 - පශ්චාත් උපාධි පර්යේෂණ හා ශිෂ්‍යත්ව	-	
15080 - ශිෂ්‍ය සඳහා පාඨමාලා ද්‍රව්‍ය හා ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම	-	
15090 - කර්මාන්ත ආධුනිකත්වය, ප්‍රායෝගික හා වෘත්තීය මාර්ගෝපදේශය	-	

15100 - ශිෂ්‍ය සංවර්ධන මුලපිරීම් සහ ප්‍රජාව	-	
15110 - විශ්වවිද්‍යාල ක්‍රීඩා කටයුතු	-	
15120 - ශිෂ්‍ය සුභසාධනය, සේවක සුභසාධනය, ශිෂ්‍ය කවුන්සිල හා සමාජ එකතුව	-	
15130 - ආයතනික සැලසුම, පාලනය හා විභිදුම	-	
15140 - වෙනත් සංවිධානවලට ප්‍රදාන	-	
15241 - දේපළ ණය මත පොලී සහනාධාරය	90,944.58	
15150 - නිවාඩු වාරප්‍රවේශපත්‍ර ගමන් බලපත්‍ර ටිකට්	4,500.00	
15160 - සංග්‍රහ වියදම්	-	
15170 - BOC පුනරාවර්තන - බැංකු ගාස්තු	4,425.00	
15180 - සම්මාන සහ වන්දි	-	
15190 - දායකත්ව සහ සාමාජික ගාස්තු	16,000.00	
15200 - උපාධිප්‍රදානෝත්සවය	-	
15210 - විභාග ගාස්තු	78,554.80	
15230 - වෙනත්	244,600.00	
15240 - ක්ෂයවීම් - කාර්යාල හා ශික්ෂණ උපකරණ	332,161.02	
15250 - ක්ෂයවීම් - පරිගණක හා පරිගණක උපාංග	294,960.00	
15260 - ක්ෂයවීම් - ගෘහභාණ්ඩ හා සවිකිරීම්	360,353.39	
15270 - ක්ෂයවීම් - පුස්තකාල පොත්	209,740.62	
15280 - ක්ෂයවීම් - සවිකිරීම් සහ උපාංග	9,208.55	
15290 - ක්‍රමක්ෂය - අස්පෘෂ්‍ය වත්කම්	4,808.22	
40100 - භාණ්ඩාගාරයෙන් පුනරාවර්තන ප්‍රදාන		21,275,000.00
40110 - විවිපකොෂ මඟින් පුනරාවර්තන ප්‍රදාන		-
40120 - පොදු සංචිත		8,139,923.30
40140 - භාණ්ඩාගාරයෙන් වියදම් කළ පුනරාවර්තන ප්‍රදාන		4,037,878.65
40150 - භාණ්ඩාගාරයෙන් වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන		849,574.66
40160 - MOHEවලින් ප්‍රාග්ධන ප්‍රදාන		7,000,000.00
40170 - ණය හා අත්තිකාරම්වලින් පොලී ආදායම		16,116.86
40180 - අරමුදල් කළමනාකරණ ගිණුමෙන් පොලී ආදායම		923,457.27
40190 -ක්‍රමක්ෂ ආදායම - ස්ථාවර තැන්පතු		-
40200 - ස්ථාවර තැන්පතුවලින් පොලී ආදායම		345,491.63
40300 - ලියාපදිංචි ගාස්තුව		60,000.00
40310 - පාඨමාලා ගාස්තුව		2,450,001.00
40320 - විභාග ගාස්තුව		235,000.00
40330 - මණ්ඩල සහතිකකරණ ගාස්තු වරප්‍රසාදය		50,000.00
40340 - අයැදුම්පත්‍ර ගාස්තුව		33,500.00
40350 - පර්යේෂණ යෝජනා ඇගයීම් ගාස්තුව		90,000.00
40360 - පුස්තකාල ගාස්තුව (ආපසු ගෙවනු නොලබන)		22,000.00
40370- වෙනත් ආදායම්		3,780.00
	57,024,572.44	**57,024,572.44**

06. විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } HED/F/01/PGIIM/2022/FA/03 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2023 මැයි 31 දින

SAT/SAB
AM 04/06

අධ්‍යක්ෂ,
දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ආයතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන ආයතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

ආයතනයේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

පිටුව 4 | 6

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගමට සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නිතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉටු කිරීමට සැලසුම් කර තිබුණු ක්‍රියාකාරකම් 36 කින් පුහුණු කිරීම්, පර්යේෂණ හා පරිගණක පද්ධති සංවර්ධනය කිරීම සඳහා වූ ක්‍රියාකාරකම් 12 ක් ඉටු කිරීමට ආයතනය අපොහොසත් වී තිබුණි.

(ආ) සිද්ධ ආයුර්වේද ක්‍රමය යටතේ පශ්චාත් උපාධි පිරිනැමීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.352,250 ක් වැයකර අධ්‍යයන මණ්ඩල හා විශේෂ මණ්ඩල 08 වතාවක් රැස් වී තිබුණද 2023 අප්‍රේල් මාසය දක්වා එම ක්‍රමය සඳහා සිසුන් බඳවාගැනීමට අපොහොසත් වී තිබුණි.

(ඇ) ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් නොවූ රු. 1,638,470 ක් වටිනා උපකරණ මිලදී ගෙන තිබුණු අතර ප්‍රසම්පාදන සැලැස්මේ වටිනාකම් ඉක්මවා රු.1,161,382 ක පුස්තකාල පොත් මිලදීගෙන තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

7.විගණකාධිපති වාර්තාවට පිළිතුර

POSTGRADUATE INSTITUTE OF INDIGENOUS MEDICINE
UNIVERSITY OF COLOMBO

Senior Professor Chrishantha Abeysena
MBBS, MSc, MD, PgDipStat, BA, MA, MA, FCCP(SL)
Director

මාගේ අංකය : PGIIM/Audit/2022.

2023 අගෝස්තු 18

විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
අංක 306/72,
පොල්දූව පාර
බත්තරමුල්ල.

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික නියාමන අවශ්‍යතා පිලිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ HED/F/01/PGIIM/2022/FA/03 දරන 2023 මැයි 31 දිනැති විගණකාධිපති වාර්තාව හා බැඳේ. ඒ අනුව මෙම වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පහත පැහැදිලි කිරීම් ඉදිරිපත් කරමි.

2.3 වෙනත් කරුණු

(අ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව සැලසුම් කර තිබුණු ක්‍රියාකාරකම් 36 කින් 12ක් ඉටු කිරීමට නොහැකිවීමට පහත කරුණු බලපා ඇත.ඉහත ක්‍රියාකාරකම් 12 න්,

01. ක්‍රියාකාරකම් 07ක් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත්තේ ආයතනයට 2022 වසර තුළ ලැබුණ මුදල් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙනි. 2022 වර්ෂයේ ආයතනය විසින් ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් සඳහා රු.මිලියන 4.5ක් හා පුනරාවර්තන වියදම් සඳහා රු.මිලියන 35ක මුදලක් මහාභාණ්ඩාගාරයෙන් ඉල්ලා තිබූ නමුත් ලැබී ඇත්තේ, පුනරාවර්තන වියදම් සඳහා රු.මිලියන 26.186ක මුදලක් පමණි. එබැවින් ලැබූ මුදල් කළමණාකරණය කර ගනිමින් අත්‍යවශ්‍ය ක්‍රියාකරකම් සඳහා ප්‍රමුඛත්වය දී ඇත.

hone: Director: 0112681610 SAR: 0112681227 SAB: 0112681510 Fax: 0112681227
l: Director: director@pgiimed.cmb.ac.lk SAR: sar@pgiimed.cmb.ac.lk SAB: sab@pgiimed.cmb.ac.lk

02. ක්‍රියාකාරකම් 02ක් නව පාඨමාලා ඇති කිරීම හා සම්බන්ධ වේ. නව පාඨමාලා ඇති කිරීම සඳහා දේශීය වෛද්‍ය විද්‍යාව සම්බන්ධ MD උපාධි පාඨමාලාවලට හා පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවලට අදාළව රටේ පවතින ඉල්ලුම සලකා බැලිය යුතු බැවින් මේ වන විට ඒ පිළිබඳව වෙළඳපොල සමීක්ෂණයක් සිදු කරමින් පවතී. තවද දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූලික ඇල්මැති පාර්ශවය (main stake holder) වන ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වෛද්‍ය විශේෂඥ ශ්‍රේණිවල පුරප්පාඩු හිඟය හේතුවෙන් ආයතනයේ නව MD උපාධි පාඨමාලා ඇති කිරීමේ ගැටලු ඇත. එසේ වුවද නව පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා දෙකක් ඇති කිරීම පිණිස විෂය නිර්දේශ සකස් කරමින් පවතී.

03. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ස්ථිර පදනම් මත කථිකාචාරවරුන් නොමැත. මෙම ආයතනයේ අධ්‍යයන කටයුතු කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍යවිද්‍යා පීඨවල ආචාර්වරුන්, ගම්පහ වික්‍රමාරච්චි විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍යවිද්‍යා පීඨවල ආචාර්වරුන්, සිද්ධ වෛද්‍ය ඒකකය යාපනය විශ්වවිද්‍යාලයේ ආචාර්වරුන්, සිද්ධ වෛද්‍ය ඒකකය - ත්‍රිකුණාමල මණ්ඩපය නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ආචාර්යවරුන් සහ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ විශේෂඥ වෛද්‍යවරුන් බාහිර කථිකාචාර්ය පදනම් මත දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සේවය කරයි. ඔවුන් සිය ස්ථිර ආයතනවල පර්යේෂණ කටයුතුවල නියැලෙන අතර එබැවින් ආයතනයේ සමූහ පර්යේෂණ සිදු කිරීමේ බාධා පවතී.

04. ගොඩනැගිල්ලක් සාදා ගැනීම සඳහා ඉඩමක් හඳුනාගෙන තිබුන ද පවතින චක්‍රලේඛ ප්‍රතිපාදන මත ගොඩනැගිලි ඉදි කිරීමට අවසර නොදෙන නිසා සහ රටේ වර්තමානයේ පවතින ආර්ථික තත්වය මත ආයතනයට ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන නොමැති වීම නිසා ආයතනයට ගොඩනැගිල්ලක් ඉදි කිරීමට නොහැකි වී ඇත.

(ආ) සිද්ධ මරුතුවම්, සිද්ධ ගුණපාඩම් යන පාඨමාලාවලට අනුමැතීන් ලබා ගැනීම පිණිස අදාල අයදුම්පත් කොළඹ විශ්වවිද්‍යාලයීය සනාතන සභා සහ පාලක සභා අනුමැතිය සහිතව තත්ව ආරක්ෂණ කේන්ද්‍රය (QAC) හරහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමුකර පැවතියද එම පාඨමාලා සඳහා තවමත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය ලැබී නැත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය ලැබුණ පසුව උක්ත පාඨමාලා ආරම්භ කිරීමට කටයුතු කරනු ලැබේ. 2023.06.01 දින සිට Senior Registrar (Post MD Siddha) Training පාඨමාලාව ආරම්භ කර,ඇත.

(ඇ) 2021 ප්‍රසම්පාදන සැලැස්ම යටතේ රු 1,638,470.00 ක් වූ උපකරණ මිලදී ගැනීමට සැලසුම් කර තිබිණි. රටේ පැවතුනු වාතාවරණය සහ කොරෝනා වසංගත තත්වය හමුවේ මෙම උපකරණ මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු මන්දගාමීව සිදු වූ අතර එම භාණ්ඩ අප ආයතනයට ලැබුනේ 2022 වර්ෂයේදීය. භාණ්ඩ ලැබුණු පසු ගිණුම්ගත කිරීම සහ මුදල් ගෙවීම සිදු කරන බැවින් මෙම උපකරණ 2022 වර්ෂයේ ගිණුම් පොත්වල සටහන් කර ඇත.

තවද 2022 සමාලෝචිත වර්ෂයේ පුස්තකාල පොත් රු. 2,161,382 ක වටිනාකමකින් (2021 ප්‍රසම්පාදන සැලැස්මට අනුව රු. 1,344,632 පොත් සහ 2022 ප්‍රසම්පාදන සැලැස්මට අනුව රු 816,750.00 ක පොත්) උපචිත පදනමින් හා අත්පිට මුදල් පදනමින් අත්පත් කරගෙන ඇත.

තවද 2021 ප්‍රසම්පාදන කටයුතු වලින් පුස්තකාල පොත් මිලදී ගැනීමට රු මිලියන 03ක් වෙන් කර තිබූ අතර ඒ යටතේ ආරම්භ කරන ලද ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් තුලින් මිලදීගත් රු. 1,344,632 ක් වටිනා පොත් සඳහා C003,C004,C016,C017 සහ C020 යන ප්‍රාග්ධන වවුචර්පත් මගින් 2022 වසරේ ගෙවීම් සිදු කර ඇත. එසේම 2022 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට අදාලව පුස්තකාල පොත් සඳහා රු මිලියනයක වෙන්කිරීමක් සිදු කර ඇත.2022 වසරේ එම වෙන්කිරීම් ඉක්මවා ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් සිදු කර නොමැති අතර එහි වටිනාකම වන්නේ ණය පදනමින් ලබා ගත් රු 816,750.00 ක් වටිනා පොත් පමණි.

අධ්‍යක්ෂ
දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

තිරසර සංවර්ධනය සඳහා යෝජනාව

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

1. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIIM) 2019 වසරේ දී පිහිටුවනු ලැබූ අතර සෞඛ්‍ය සේවා, විශ්වවිද්‍යාල සහ පෞද්ගලික අංශය සඳහා අවශ්‍ය කරන මානව සම්පත සම්පූර්ණ කිරීම පිණිස ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලැබේ. සෞඛ්‍ය ව්‍යවස්ථා සංග්‍රහයට අනුව සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ආයුර්වේද, සිද්ධ සහ යුනානි යන ප්‍රධාන විශේෂඥ ක්ෂේත්‍රවල විශේෂඥ වෛද්‍යවරු සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ආයුර්වේද, යුනානි සහ සිද්ධ ආයතන සඳහා විශේෂඥයින් සැපයීම දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වගකීම වේ. ඒ අනුව දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් දිවයිනේ මිනිස් බල අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීම සඳහා පුහුණු වැඩසටහන් ආරම්භ කිරීම පිණිස සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇත. මෙම අරමුණ ඉටු කර ගැනීම පිණිස 2020 වසරේ දී දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලදී. දේශීය වෛද්‍ය විද්‍යා විෂය ක්ෂේත්‍රය පිළිබඳ විශේෂඥ වෛද්‍ය උපාධි වැඩසටහන් පිරිනැමීම තුළින් දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය **සියලුම වයස් කාණ්ඩවල තැනැත්තන් සඳහා සෞඛ්‍යසම්පන්න දිවිපැවැත්මක් සහතික කිරීමට සහ ඔවුන්ගේ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීමට** අනුබල දෙනු ලබයි.

2. ආයතනය ශ්‍රී ලංකාවේ දේශීය වෛද්‍ය අංශය සඳහා සුදුසුකම්ලත් විශේෂඥ වෛද්‍ය උපාධිධාරීන් බිහි කිරීම පිණිස අධ්‍යන කටයුතු පවත්වාගෙන යනු ලැබේ. ඒ අනුව ආයතනය මඟින් තත්ත්ව සහතික වැඩසටහන් හරහා විශේෂඥ වෛද්‍ය උපාධි පුහුණුවන්නන්ගේ ඉහළම ගුණාත්මකභාවය පිණිස ශික්ෂණය පිරිනැමීමේ පරමාර්ථය ඇතිව දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සඳහා තත්ත්ව සහතික මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා මූලික සැලසුම් සකස් කර ඇත. තවද ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීමේදී අවශවන ඉගෙනුම් තොරතුරු මූලාශ්‍ර ශිෂ්‍යයන් වෙත ලබාදීම ඉතා වැදගත්ය. එසේම මෙම තොරතුරු සම්පත් විවිධ ව්‍යාප්ති සේවා හරහා ලබාදීම සිදුකර හැක. සියල්ලන්ට සමාන වූ තොරතුරු වෙත ප්‍රවේශවීමේ අවස්ථාව ලබාදීම, එසේම අධ්‍යාපනික අවස්ථා අවශ්‍යතා සඳහා කියවීමේ පහසුකම් සැපයීම මඟින් නිරන්තරව පර්යේශණයන්හි හා අධ්‍යාපනික කටයුතු වල නිරතවීමට කාලය හා අවස්ථාව පර්යේෂකයන් සඳහා හිමිවනු ඇත. එබැවින් එය ගුණාත්මක අධ්‍යාපනයක් හා අධ්‍යාපනයේ ගුණාත්මක බව ඉහළ නැංවීමට උපකාරී වනු ඇත. පුස්තකාලය යනු අධ්‍යාපන ආයතනයක හදවත යනුවෙන් හැඳින්වේ. පශ්චාත් උපාධි ආයතනයක පුස්තකාලය යනු පර්යේෂණ වල නියැලෙන පර්යේශකයින් හට දැනුම ලබාදෙන දැනුම් උල්පතයි. අධ්‍යන මණ්ඩල වල උපදෙස් පරිදි එකතු සංවර්ධනය සිදු කරගෙන යන අතර පුස්තකාලයේ අරමුණ වනුයේ මූලික වශයෙන් ඒ ඒ විෂයන්ට අදාළ මුද්‍රිත එකතුවක් ගොඩනැගීමෙන් අනතුරුව ඉලෙක්ට්‍රොනික් එකතුවක් ආරම්භ

කිරීම හා සංවර්ධනය කරමින් ඊ පුස්තකාලයක් සංවර්ධනය කිරීමයි. ඒ අතරතුර විවිධ වශයෙන් පුස්තකාලය මඟින් විවිධ තොරතුරු වැඩමුළු සංවිධානය කිරීමට නියමිතයි. පුස්තකාල මූලාශ්‍ර භාවිතයට කියවීමේ අධ්‍යන කටයුතු වල නිරතවීමේ පහසුකම් ලබාදීම, අන්තර්ජාල පහසුකම් සැපයීම හා පරිගණක පහසුකම් සැපයීම යන ආකාරයට යටිතල පහසුකම් වර්ධනය කිරීමද ගුණාත්මක අධ්‍යාපනයට මගපාදයි **ශ්‍රී ලංකාව තුළ ගුණාත්මක අධ්‍යාපනය වැඩිදියුණු කිරීමට සහ ජීවිත කාලය පුරා ඉගෙනුම් අවස්ථාවන් ප්‍රවර්ධනය කිරීමට** අනුග්‍රහය දක්වනු ලැබේ.

3. ආයතනය **සෑමවිටම ස්ත්‍රී-පුරුෂ සාධාරණත්වය සහ සමානාත්මතාව** පවත්වා ගැනීම පිණිස පියවර ගනු ලබයි. එහිදී පුස්තකාලය මඟින් වෛද්‍ය සිසුන්ගේ තොරතුරු අවශ්‍යතා සඳහා සහය වෙමින් තොරතුරු වෙත ප්‍රවේශවීමේ සිට එම තොරතුරු අත්පත් කර ගැනීම දක්වා වැඩ කටයුතු කරනු ලබයි. ඒ අනුව තොරතුරු සඳහා සාධාරණ ප්‍රවේශය, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, පුද්ගල නිදහස, සංස්කෘතික නිදහස හා **ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය** පුස්තකාලය තුළ ආරක්ෂා කෙරෙනු ඇත.

4. මෑතක දී පිහිටුවන ලද ආයතනයක් ලෙස දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය **සියලුම තැනැත්තන් සඳහා ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීමට ඇති හැකියාව සහ තිරසර කළමනාකරණය තහවුරු කිරීම** පිළිබඳ ක්‍රියාවලිය දියත් කරමින් ඇත. මේ සඳහා මූලාරම්භයක් ලෙස, ආයතනය මඟින් කුණු කසළ දිරාපත් වන ද්‍රව්‍ය - වීදුරු, පොලිතීන්/ ප්ලාස්ටික් සහ කඩදාසි ආදී ලෙස වෙන් වෙන් වශයෙන් කාණ්ඩ කර, යෝග්‍ය පරිදි බැහැර කිරීම සඳහා පියවර ගෙන ඇත.

5. ආයතනය ශ්‍රී ලංකාව තුළ දේශීය වෛද්‍ය අංශය තුළ ආයුර්වේද, සිද්ධ සහ යුනානි යන ක්ෂේත්‍ර සඳහා විශේෂඥ වෛද්‍ය උපාධි පිරිනමනු ලබයි. මෙම විශේෂඥ වෛද්‍ය උපාධි වැඩසටහන් සඳහා විවිධ ජාතීන්ට අයත් පුහුණුවන්නන් සහභාගී වෙයි. මේ වන විට ආයුර්වේදය පිළිබඳ විශේෂඥ වෛද්‍ය උපාධි වැඩසටහන් පමණක් ආරම්භ කර ඇති අතර නුදුරු අනාගතයේදීම යුනානි පිළිබඳ විශේෂඥ වෛද්‍ය උපාධි වැඩසටහන් සඳහා පළමු ශිෂ්‍ය කණ්ඩායම බඳවා ගැනීම පිණිස පියවර ගෙන ඇත. තව ද, සිද්ධ පිළිබඳ විශේෂඥ වෛද්‍ය උපාධි වැඩසටහන් ද ඉතා ඉක්මනින් හඳුන්වාදීම සඳහා අවශ්‍ය මූලික කටයුතු ඉටු කරමින් තිබේ. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විවිධ ජාතීන් සහ ආගම්වලට අයත් පුහුණුවන්නන් අතර අන්‍යෝන්‍ය සුහදතාව ගොඩනැගීම පිණිස අවශ්‍ය සියලුම පියවර ගනු ලබයි.

6. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් පිරිනමනු ලබන සියලුම විශේෂඥ වෛද්‍ය උපාධිවල පශ්චාත්-විශේෂඥ උපාධි වැඩසටහනේ අවසන් වසර සඳහා එක් අවුරුදු විදේශීය පුහුණුවක් ඇතුළත් වේ. මේ සඳහා දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් වෙනත් රටවල අධ්‍යාපන ආයතන සමඟ අවබෝධාත්මක ගිවිසුම්වලට එළැඹීමට සැලසුම් කරමින් ඇත. (විශේෂයෙන්ම විශේෂඥ වෛද්‍ය උපාධිධාරීන් සඳහා අවසන් වසර පුහුණුව ලබා ගැනීම පිණිස ඉන්දියාවේ උසස් අධ්‍යාපන ආයතන සමඟ ගිවිසුම්වලට එළැඹීමට අපේක්ෂා කරනු ලැබේ. මෙම ක්‍රියාවලිය හරහා දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් එහි ශිෂ්‍යයින්ට සහ කාර්ය මණ්ඩලයට ජාතික සහ අන්තර්ජාතික සබඳතා ගොඩනඟා ගැනීම සඳහා අවකාශය සලසා දෙනු ලැබේ.)
7. තවද අන්තර්ජාතික වශයෙන් වැදගත් තොරතුරු මූලාශ්‍ර සඳහා ප්‍රවේශය ලබාගැනීම් මඟින් දැනුම් සම්භාරයක් සිසුන්ට ලබාගත හැකි වේ. පුස්තකාල ජාල සමඟ සම්බන්ධ වෙමින් නව දැනුම් උත්පාදනයන් සඳහා ප්‍රවේශ වීමට කටයුතු යොදා ඇත. ඒ අනුව ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණ තොරතුරු ජාලය, සෞඛ්‍ය සාහිත්‍ය, පුස්තකාල හා තොරතුරු විද්‍යාව යන ජාල සඳහා, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය, ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය යන ආයතන හා පුස්තකාල තොරතුරු ජාල සමඟ සම්බන්ධ වෙමින් අන්තර් සහයෝගීතාවය ඇති කර ගැනීමට කටයුතු කර ඇත. ඒ අනුව නව දැනුම් උප්පාදනයන්ට, පර්යේශනයන් සඳහා අවශ්‍ය වන දැනුමින් සන්නද්ධ කිරීම සඳහා වන පුස්තකාල හා තොරතුරු සේවාවන් පුස්තකාලය විසින් පවත්වාගෙන යනු ලබයි.